75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025

මුදල් ප්‍රතිපත්ති වාර්තාව

2025 පෙබරවාරි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

මුදල් ප්‍රතිපත්ති වාර්තාව වසරකට දෙවරක් පළ කෙරෙනු ලබන ප්‍රකාශනයකි. මෙම වාර්තාවේ අන්තර්ගතය, 2025 වසරේ ජනවාරි මස 29 වැනි දින සිදු කළ මුදල් ප්‍රතිපත්ති නිවේදනය සමඟ නිමාවට පත් වුණු ශ්‍රී ලංකා මහ බැංකුවේ 2025 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති තීරණ වාරය වනවිට පැවති දත්ත මත මූලික වශයෙන් පදනම් වේ.

© ශ්‍රී ලංකා මහ බැංකුව

ISBN 978-624-5917-94-5

2025 පෙබරවාරි 14

පටුන

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව 4

සාරාංශය 6

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය 7

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම 9

2.1. මූලික පුරෝකථන 9
උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම 9
විශේෂ සටහන (අ): උද්ධමන ව්‍යාප්ති සටහන පිළිබඳ හැඳින්වීමක් 13
මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම 14

2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන 15
ගෝලීය පරිසරය 15
රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග 16
විදේශීය ජංගම ගිණුම 16

2.3. පුරෝකථන මත පවතින අවදානම් 16
උද්ධමන පුරෝකථන මත පවතින අවදානම් 17
ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම් 18

2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම 19
මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන 19
උද්ධමනයේ හැසිරීම 21

3. වර්තමාන ආර්ථික තත්ත්වය 22

3.1. උද්ධමනය 22
විශේෂ සටහන (ආ): ශ්‍රී ලංකාවේ වත්මන් අවධමන තත්ත්වයට බලපාන මිල ප්‍රවණතා සහ මහජන අදහස් 25

3.2. මූර්ත අංශය 29

3.3. මුදල් අංශය 31
පොලී අනුපාතික 31
දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව 32
දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම 33

3.4. විදේශීය අංශය 35
ගෙවුම් තුලනය 35
විනිමය අනුපාතිකය 38
සංචිත වත්කම් 38

3.5. රාජ්‍ය මූල්‍ය අංශය 39

3.6. මූල්‍ය අංශය 41

3.7. ගෝලීය ප්‍රවණතා 43

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති රාමුව

2023 අංක 16 දරන ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණ වනුයේ දේශීය මිල ස්ථායීතාව ළඟාකර ගැනීම සහ පවත්වාගෙන යාමයි. අඩු සහ ස්ථාවර මට්ටමක උද්ධමනය පවත්වා ගැනීම තුළින්, තිරසාර ආර්ථික වර්ධනයට සහ මහජනතාවගේ ආර්ථික සහ මූල්‍ය යහපැවැත්ම සඳහා මහ බැංකුව දායක වේ.

දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව මුදල් ප්‍රතිපත්තිය මෙහෙයවයි. ශ්‍රී ලංකා මහ බැංකු පනතට අනුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය, නම්‍යශීලී උද්ධමනය ඉලක්කකරණ රාමුවට අනුකූලව, මුදල් ප්‍රතිපත්තිය සම්පාදනය කිරීමේ සහ නම්‍යශීලී විනිමය අනුපාත ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. මුදල් අමාත්‍යවරයා සහ මහ බැංකුව අතර ඇතිකරගත් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම මගින් තීරණය කර ඇති ඉලක්කගත මට්ටමේ උද්ධමනය පවත්වා ගැනීම නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවේ අරමුණයි. 2023 ඔක්තෝබර් 5 වැනි දින රජයේ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද වත්මන් මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුමට අනුව, මහ බැංකුව කාර්තුමය මතුපිට උද්ධමනය සියයට 5ක මට්ටමක පවත්වා ගත යුතු වේ.[1]

උද්ධමන ඉලක්කය සපුරා ගැනීම සඳහා කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික අපේක්ෂිත මාර්ගය ඔස්සේ හැසිරවීමට මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති උපකරණ භාවිත කරයි. මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය වැඩිදියුණු කිරීම සහ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය සරල කිරීම අරමුණු කරගනිමින්, 2024 නොවැම්බර් 27 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව සිය ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට මාරු විය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා එහි මූලික මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දුන්නේය.[2] මෙම වෙනස සමගින්, අන්තර් බැංකු වෙළඳපොළ තුළ බැංකු එකිනෙකා සමඟ ගනුදෙනු කරන පොලී අනුපාතිකය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රකාශයට පත් කරනු ලබන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නයේ පවත්වා ගැනීමට මහ බැංකුව විසින් ඉලක්ක කරනු ඇත. මහ බැංකුවේ නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ මෙහෙයුම් ඉලක්කය ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් ක්‍රියා කරයි. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව පවත්වා ගෙන යන එක්දින පොලී අනුපාතික මූල්‍ය වෙළඳපොළ හරහා ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය වන අතර, එය අවසානයේ උද්ධමනය කෙරෙහි බලපෑම් ඇති කරයි.

මුදල් ප්‍රතිපත්ති තීරණ දත්ත මත පදනම් වේ. මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් උද්ධමනය කෙරෙහි පූර්ණ බලපෑමක් ඇති කිරීමට කාලය ගතවන බැවින්, මුදල් ප්‍රතිපත්ති තීරණ ඉදිරි දැක්මක් සහිත විය යුතුය. සුදුසු මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තීරණය කිරීම සඳහා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය වසරකට හය වරක් රැස්වේ. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ දී මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය උද්ධමනය සහ උද්ධමන ඉදිරි දැක්ම, පවත්නා දත්ත මත පදනම් වූ ආර්ථිකයේ වත්මන් තත්ත්වය සහ ඉදිරි දැක්ම, පුරෝකථනය සහ පුරෝකථනය ආශ්‍රිත අවදානම් සහ අවිනිශ්චිතතා

[1] අංක 2352/20 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් උද්ධමන ඉලක්කය මහජනතාවට සන්නිවේදනය කරන ලදී. කාර්තුමය මතුපිට උද්ධමනය යනු අනුරූප කාර්තුවේ මාස තුන තුළ මාසික කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ වාර්ෂික ප්‍රතිශතාත්මක වෙනස් වීමේ සරල සාමාන්‍යයයි.

[2] නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතික ලෙස නොසලකනු ලබන අතර, සහභාගී වන ආයතනවලට මහ බැංකුව සමඟ එක්දින ගනුදෙනු සිදු කිරීම පිණිස නිත්‍ය පහසුකම් සඳහා අදාළ අනුපාතිකය ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය කලින් තීරණය කළ ආන්තික සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කර ඇත. වැඩි විස්තර සඳහා, මහ බැංකු වෙබ් අඩවියේ ඇති එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීම පිළිබඳ දැනුම්වත් කිරීමේ සටහන බලන්න.

ඇගයීමක් සිදු කරයි. මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර තාක්ෂණික කමිටුවක් වන මුදල් ප්‍රතිපත්ති කමිටුව, මුදල් ප්‍රතිපත්ති මණ්ඩලයේ සලකා බැලීම සඳහා තාක්ෂණික නිර්දේශ සපයයි.

මහ බැංකු පනතෙහි 27 සහ 80 වගන්ති සපුරාලීම සඳහා මුදල් ප්‍රතිපත්ති වාර්තාව සකස්කර ඇති අතර, මහ බැංකු පනතට අනුව උද්ධමනයේ මෑත කාලීන හැසිරීම, උද්ධමනය සඳහා මුල් වූ හේතු සාධක, උද්ධමනය සඳහා වන මැදි කාලීන පුරෝකථන, එවැනි පුරෝකථන සඳහා ඇති ප්‍රධාන අවදානම් මෙන්ම මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ එහි අරමුණු සාක්ෂාත් කර ගැනීම විස්තර කෙරෙන ද්විවාර්ෂික වාර්තාවක් මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම අවශ්‍ය වේ. මීට අමතරව, මෙම වාර්තාව මගින් ආර්ථිකයේ අනෙකුත් විවිධ අංශවල වත්මන් ප්‍රවණතා මහජනතාවට සන්නිවේදනය කරන අතර ම, ආර්ථික වර්ධනයේ ඉදිරි දැක්ම සහ ඒ ආශ්‍රිත අවදානම් පිළිබඳ තක්සේරුවක් සපයයි.

සාරාංශය

යථා තත්ත්වයට පත් වූ සාර්ව ආර්ථික ස්ථාවරත්වය මධ්‍යයේ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ශක්තිමත් වීමත් සමඟ ශ්‍රී ලංකා ආර්ථිකය 2024 වසරේ දී ද ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කළේය. 2022/23 වසරවල ඉහළ උද්ධමන කාලපරිච්ඡේදයෙන් පසුව අඩු මට්ටමක පැවති උද්ධමනය, 2024 වසරේ දී තවදුරටත් අඩු වූ අතර, වසර අවසාන භාගයේ දී ඍණ උද්ධමනයක් වාර්තා විය. මෙලෙස මිල පීඩනය පහත වැටීමත් සමඟ ඉහළ යන ආදායම් මට්ටම්වල ද සහායයෙන්, අර්බුදකාරී කාලපරිච්ඡේදයෙන් පසුව, ක්‍රය ශක්තිය ක්‍රමිකව යථා තත්ත්වයට පත්වෙමින් ව්‍යාපාර සහ ගෘහ ඒකක මුහුණ දුන් පීඩාවන් යම් මට්ටමකට සමනය වී ඇත. 2024 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව එහි ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ඉදිරියට ගෙන ගිය අතර, එමගින් උද්ධමන පීඩනය අඩු පරිසරයක් තුළ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය ලබා දෙන ලදී.

විදුලි ගාස්තු, ඉන්ධන සහ එල්. පී. ගෑස් මිල ගණන් සහ ප්‍රවාහන වියදම් අඩු කරමින් කිහිපවරක් සිදු කෙරුණු සංශෝධන සමගින් ආහාර මිල පහත වැටීම උද්ධමනය මන්දගාමී වීමට දායක වූ අතර, වසර අවසානය වන විට උද්ධමනය ඍණ මට්ටමට පත් විය. උද්ධමන අපේක්ෂාවන් ද පහළ මට්ටමක පැවතුණි.

යටිදැරි ඉල්ලුම් තත්ත්වයන් වර්ධනය වීම සහ වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත උද්ධමනය අඩු වීමට බලපාන සංඛ්‍යානමය පදනමේ බලපෑම අඩුවීම හේතු කොටගෙන මතුපිට උද්ධමනය ධන මට්ටම් කරා ඉහළ යාමට පෙර 2025 වසරේ මුල් භාගයේ දී ඍණ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2025 වසරේ අග සහ 2026 වසරේ මැද භාගය අතර කාලයේ දී මතුපිට උද්ධමනය ඉලක්කයට වඩා යම් ප්‍රමාණයකින් ඉහළ යා හැකි වුවද, මෙම අපගමනය කෙටි කාලීන වනු ඇති බව පුරෝකථන මගින් පෙන්නුම් කෙරේ. මේ අතර, මූලික උද්ධමනය ද 2025 වසරේ මුල් භාගයේ දී තාවකාලිකව පහළ මට්ටමක පවතිනු ඇතැයි පුරෝකථනය කර ඇතත්, පසුව එම උද්ධමනය ස්ථාවර වනු ඇත.

මහ බැංකුව සිය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වසර පුරා පවත්වාගෙන ගිය අතර, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දීමත් සමඟ මුදල් ප්‍රතිපත්තිය තවදුරටත් ලිහිල් කළේය. කෙසේ වෙතත්, මෙම තාවකාලික අවධමන තත්ත්වය සඳහා යටිදැරි ඉල්ලුම් තත්ත්වවලට වඩා සැපයුම් අංශයේ හිතකර තත්ත්ව ප්‍රධාන වශයෙන් හේතුවීම සැලකිල්ලට ගනිමින්, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කිරීම සඳහා වඩාත් සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කරන ලදී. මෙම ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබිඹු කරමින් පුද්ගලික අංශය සඳහා ලබා දෙන ණය පුළුල් පදනමකින් යුක්තව ප්‍රසාරණය වීමට පහසුකම් සලසමින්, වෙළඳපොළ පොලී අනුපාතික තවදුරටත් පහත වැටුණි.

ලිහිල් මුදල් ප්‍රතිපත්තිය, පුද්ගලික අංශයට ලැබෙන ණය ප්‍රමාණය වැඩි වීම, ව්‍යාපාර සහ පාරිභෝගික විශ්වාසය වැඩිදියුණු වීම සහ ශක්තිමත් බාහිර ඉල්ලුම යනාදියේ සහායයෙන් ආර්ථිකය ශක්තිමත්ව යථා තත්ත්වයට පත් වූ අතර, 2017 වසරෙන් අනතුරුව වාර්තා වූ ඉහළම වර්ධනය වන සියයට 5ක පමණ වාර්ෂික වර්ධනයක් 2024 වසරේ දී වාර්තා කරනු ඇතැයි අපේක්ෂිතය. අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සහ වර්ධනය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමත් සමඟ මැදි කාලීනව මෙම වර්ධන ප්‍රවණතාව තිරසාරව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

උද්ධමනය සහ ආර්ථික වර්ධන පුරෝකථන සඳහා වන අවදානම් පිළිබඳ ව සලකා බැලීමේ දී කෙටි කාලීනව මෙන්ම මැදි කාලීනව මෙම අවදානම් සඳහා බොහෝදුරට සමතුලිත ඉදිරි දැක්මක් පවතී.

1. මුදල් ප්‍රතිපත්ති සාරාංශය

ශ්‍රී ලංකා මහ බැංකුව 2023 වසරේ ජූනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන යමින් 2024 වසරේ දී සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කරන ලද අතර 2025 වසරේ මුල් කාලයේදී ද එම ස්ථාවරය පවත්වාගෙන ගියේය.

මහ බැංකුව 2023 වසරේ දෙවන භාගයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 650කින් සැලකිය යුතු ලෙස අඩු කිරීමෙන් පසුව, 2024 වසරේ දී මුදල් ප්‍රතිපත්ති විවරණ වාර තුනක දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 125කින් පහළ දැමීය. 2024 වසරේ මාර්තු මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 50කින් අඩු කරන ලද අතර, ප්‍රතිපත්ති පොලී අනුපාතිකවල පහළ යෑමට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑම සඳහා යම් අවකාශයක් ලබා දීමෙන් පසුව, 2024 වසරේ ජූලි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික පදනම් අංක 25කින් තවදුරටත් අඩු කරන ලදී. අඩු වූ උද්ධමන පීඩන, අඩු උද්ධමන අපේක්ෂා මෙන්ම විදේශීය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ යෑම මෙම ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, ඇතැම් වෙළඳපොළ ණය පොලී අනුපාතික පහළ යෑමේ වේගය මන්දගාමී වීම හේතුවෙන් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වෙළඳපොළ වෙත ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම ඉහළ නැංවීම සඳහා තවදුරටත් ප්‍රතිපත්තිමය බලපෑමක් අවශ්‍ය විය.

මේ අතර, ප්‍රතිපත්ති ලිහිල් කිරීම් මගින් අපේක්ෂිත ප්‍රතිඵල විශේෂයෙන් ම, වෙළඳපොළ ණය පොලී අනුපාතික අඛණ්ඩව පහළ යෑම, පෞද්ගලික අංශයට ලබා දෙන ණය ප්‍රසාරණය වීම සහ අඩු උද්ධමනකාරී පරිසරයක් මධ්‍යයේ දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත් වීමත් සමඟ මහ බැංකුව 2024 වසරේ අගෝස්තු මාසයේ සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්කිරීම් තාවකාලිකව නැවැත්වූ අතර, නුදුරු කාලීනව අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළ අවධමන තත්ත්වයක් පුරෝකථනය කිරීමත් සමඟ 2024 වසරේ නොවැම්බර් මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය තවදුරටත් පහළ දැමීය. මහ බැංකුව 2024 වසරේ දී එහි ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීම මුදල් ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ක්‍රියාත්මක කිරීමේ එක් සුවිශේෂී අවස්ථාවක් විය. ඒ අනුව, 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුවේ ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (Overnight Policy Rate - OPR) හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතිකයේ පදනම් අංක 50ක පමණ අඩුවීමක් පිළිබිඹු කරමින් එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සියයට 8.00ක් ලෙස තීරණය කෙරුණි.

ප්‍රධාන වශයෙන් සැපයුම් අංශයේ සාධක හේතුවෙන් නුදුරු කාලයේ දී අවධමනය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි අගයක් වාර්තා විය හැකි වුවද 2025 වසරේ දෙවන භාගය වන විට උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ළඟා වීමේ පුරෝකථන සැලකිල්ලට ගනිමින් 2025 වසරේ ජනවාරි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතිකය නොවෙනස්ව පවත්වා ගන්නා ලදී.

2025 වසරේ දෙවන මුදල් ප්‍රතිපත්ති විවරණය සඳහා මුදල් ප්‍රතිපත්ති මණ්ඩලය 2025 මාර්තු මාසයේ දී රැස්වීමට නියමිතය.

පසුගිය මුදල් ප්‍රතිපත්ති වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේ සිට ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණ (2024 අගෝස්තු - 2025 ජනවාරි):

2024 සැප්තැම්බර්	2024 නොවැම්බර්	2025 ජනවාරි
ප්‍රතිපත්ති පොලී අනුපාතික 8.25% (නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය) සහ 9.25% (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය) යන මට්ටමේ නොවෙනස්ව පවත්වාගෙන යන ලදී.	එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස හඳුන්වා දුන් අතර, පදනම් අංක 50කින් පමණ අඩු කිරීමක් සමඟ එය 8.00%ක් ලෙස තීරණය කරන ලදී.	එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය 8.00% මට්ටමේ නොවෙනස්ව පවත්වාගෙන යන ලදී.

මුදල් ප්‍රතිපත්ති විවරණ මාධ්‍ය නිවේදන සඳහා QR කේතය භාවිත කරන්න

2. උද්ධමනයේ සහ ආර්ථිකයේ ඉදිරි දැක්ම

උද්ධමනය සහ මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ පුරෝකථන කෙරෙහි අවධානය යොමු කරමින්, 2025 වසරේ ජනවාරි මාසයේ දී එළඹුණු මුදල් ප්‍රතිපත්ති තීරණයට සහාය දැක්වීම සඳහා මහ බැංකු කාර්යමණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ මෙම කොටසේ දක්වා ඇත.[3] මෙම පුරෝකථන මගින්, 2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, ප්‍රධාන විචල්‍යයන්හි නුදුරු කාලීන පුරෝකථන, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන, සහ උපකල්පන හා විනිශ්චයන් පිළිබිඹු කෙරෙන අතර, මෙම පුරෝකථන මෙම වාර්තාවෙහි මූලික පුරෝකථන (baseline forecast) ලෙස සැලකේ.

2.1. මූලික පුරෝකථන

2025 වසරේ ජනවාරි මාසයේ දී සිදු කරන ලද නුදුරු කාලීන පුරෝකථනයන්ට අනුව, වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2025 වසරේ පළමු කාර්තුවේ දී තවදුරටත් පහළ යනු ඇති අතර, මේ සඳහා මූලික වශයෙන් බලශක්ති ගාස්තු පහත දැමීම සහ උද්ධමනය පහළ යෑමට දායක වන සංඛ්‍යානමය පදනම් බලපෑම යනාදිය හේතු වේ. කෙසේ වෙතත්, උද්ධමනය 2025 වසරේ දෙවන කාර්තුවේ දී ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. මැදි කාලීන පුරෝකථනවලට අනුව, මතුපිට උද්ධමනය 2025 වසරේ තෙවන කාර්තුවේ දී සැලකිය යුතු ලෙස වැඩි වනු ඇති අතර, එය 2026 වසරේ මැද භාගය වන විට උද්ධමන ඉලක්කයේ සිට ප්‍රතිශතාංක 2ක් පමණ ඉහළින් පැවතීමේ හැකියාවක් ඇත. එසේ වුවද, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහායයෙන් මැදි කාලීනව මතුපිට උද්ධමනය ඉලක්කගත සියයට 5 ක මට්ටමට ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. නවතම තත්කාලීන පුරෝකථන මගින් 2024 වසරේ සිව්වන කාර්තුව සඳහා මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය 2024 වසරේ පළමු කාර්තු තුනේ පැවති ධනාත්මක වර්ධනය පවත්වා ගනිමින් ශක්තිමත් වීමක් අපේක්ෂා කරයි. මැදි කාලීනව ආර්ථික වර්ධනය අඩු වේගයකින් වුවද, අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දැනට පවතින ලිහිල් මුදල් තත්ත්ව මගින් ආර්ථික වර්ධනය වේගවත් කිරීමට අපේක්ෂා කරන අතර, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න අපේක්ෂිත ලෙස අඛණ්ඩව පවත්වාගෙන යෑම මැදි කාලීනව ආර්ථිකය සංකෝචනය වීම කෙරෙහි බලපෑමක් ඇති කරයි. තවද, මැදි කාලීන ආර්ථික වර්ධන ඉදිරි දැක්ම ගෝලීය හා දේශපාලනික වාතාවරණය මගින් ඇති කරනු ලබන සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට යටත්ව පවතී.

උද්ධමනය පිළිබඳ ඉදිරි දැක්ම

නවතම නුදුරු කාලීන පුරෝකථනයන්ට අනුව, දැනට පවතින අවධමන තත්ත්වයේ (කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) පදනම් කරගත්, වාර්ෂික ලක්ෂ්‍යමය) 2025 වසරේ පළමු කාර්තුවේ සාමාන්‍යය අපේක්ෂා කළ මට්ටමට වඩා ඉහළ අගයක පවතිනු ඇතැයි පුරෝකථනය කෙරේ. මේ සඳහා 2025 වසරේ ජනවාරි මස 18 දින සිට බලාත්මක වූ සැලකිය යුතු විදුලි ගාස්තු පහළ දැමීම සහ සාපේක්ෂව අඩු නිතර මිල උච්චාවචන සහිත

[3] මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව විසින් අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් වන කාර්තුමය පුරෝකථන ආකෘතිය (Quarterly Projection Model-QPM) භාවිතා කරනු ලැබේ. සෑම මුදල් ප්‍රතිපත්ති වාරයක දී ම මෙම පුරෝකථන යාවත්කාලීන කරනු ලබන අතර, ඒ සඳහා, වෙනත් මූලාශ්‍ර අතර, ගෝලීය සාර්ව ආර්ථික පුරෝකථන සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාසික උද්ධමන දත්ත සහ දළ දේශීය නිෂ්පාදිතයේ කාර්තුමය දත්ත ද ඇතුළු ව, නවතම ආර්ථික ප්‍රවණතා පිළිබඳ දත්ත සහ තොරතුරු භාවිතා කෙරේ.

ආහාර උද්ධමනය පිළිබඳ අපේක්ෂා බලපා ඇත. මීට අමතරව, මෙම අවධමන තත්ත්වය සඳහා එකතු කළ අගය මත බදු සංශෝධන සහ අයහපත් කාලගුණික තත්ත්ව නිසා ඇති වූ සැපයුම් අංශයෙහි බාධා මගින් ඇතිකරන ලද සැලකිය යුතු මට්ටමේ ආහාර උද්ධමනය හේතුවෙන්, 2024 වසරේ මුල් භාගයේ දී මිල ගණන් ඉහළ යෑම මගින් ඇති කරන ලද සංඛ්‍යානමය පදනම් බලපෑම ද දායක වනු ඇත. පුරෝකථනයන්ට අනුව, මතුපිට උද්ධමනය 2025 වසරේ දෙවන කාර්තුවේ දී ඉහළ ගොස් ශූන්‍ය මට්ටම ආසන්නයේ පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ තෙවන කාර්තුව තුළ දී උද්ධමනය තවදුරටත් ඉහළ ගොස් උද්ධමන ඉලක්කය වන සියයට 5 කරා ළඟා වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2025 වසරේ දෙවන කාර්තුව සහ තෙවන කාර්තුව තුළ මතුපිට උද්ධමනයේ අපේක්ෂිත ඉහළ යෑම සඳහා මූලික වශයෙන් සැලකිය යුතු අහිතකර පදනම් බලපෑම, ලෝක ආහාර උද්ධමනයේ

01 රූප සටහන: මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2013=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කො.පා.මි.ද. (2021=100, ඍතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.

සටහන: පුරෝකථනයක් යනු පොරොන්දුවක් හෝ බැඳීමක් නොවේ

2025 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති දත්ත, උපකල්පන සහ විනිශ්චයන් පුරෝකථන මගින් පිළිබිඹු කරයි. ගෝලීය බලශක්ති සහ ආහාර මිල පිළිබඳ වන පුරෝකථන; ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වන ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථික වර්ධනය; ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනේ පුරෝකථන අනුව අපේක්ෂිත දේශීය රාජ්‍ය මූල්‍ය ඉදිරි දැක්ම; සහ ඇමරිකා එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මගින් නිරූපණය වන ගෝලීය මූල්‍ය තත්ත්ව යනාදී කරුණු මත මෙම පුරෝකථන රඳා පවතී. තවද, ආර්ථික ආකෘති මගින් ලබාදෙන පොලී අනුපාතික මාර්ගය සහ එහි ප්‍රතිඵලයක් ලෙස ඇතිවන සාර්ව ආර්ථික ක්‍රියාමාර්ග මත පුරෝකථන රඳා පවතී. තවද, මූලික පුරෝකථනවල දී ප්‍රධාන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිවලින් විශාල වශයෙන් විතැන් වීමක් අපේක්ෂා නොකෙරේ. එබැවින්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන යෑම සහ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්න මෙයට අදාළ වේ. මෙම උපකල්පනවල සිදුවන සැලකිය යුතු මට්ටමේ වෙනස්කම් සැබෑ උද්ධමනය පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට හේතු විය හැකිය. මැදි කාලීන සාර්ව ආර්ථික පුරෝකථන, උද්ධමන ව්‍යාප්ති සටහන් සමඟින්, එක් එක් මුදල් ප්‍රතිපත්ති වාරය තුළ අඛණ්ඩව යාවත්කාලීන කෙරේ. අස්ථාවර ගෝලීය පරිසරය සහ දේශීය ආර්ථිකයේ ඇති අවිනිශ්චිතතා සැලකිල්ලට ගනිමින්, මූලික පුරෝකථන, පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා අවදානම් පැවතිය හැකිය. මූලික පුරෝකථනයට ඇති අවදානම් පිළිබඳ විස්තර "පුරෝකථන මත පවතින අවදානම්" කොටසේ දී සාකච්ඡා කෙරේ.

වේගවත් ඉහළ යෑමක්, සහ ඉල්ලුම් පීඩනය ක්‍රමයෙන් වර්ධනය වීම හේතු වනු ඇත. මතුපිට උද්ධමනය 2025 වසරේ සිව්වන කාර්තුවේ දී මෙන්ම 2026 වසරේ පළමු කාර්තුවේ දී ද වේගවත් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, 2026 වසරේ දෙවන කාර්තුව තුළ උද්ධමන ඉලක්කයට වඩා ප්‍රතිශතාංක 2ක් ඉහළට ආසන්නව උපරිම අගයක් ගනු ඇතැයි ද අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ඇස්තමේන්තුගත වැඩිවීම සඳහා වැඩි වශයෙන් බලපෑ පදනම් බලපෑම පසුකාලීන කාර්තුවල දී අඩුවීමක් අපේක්ෂා කරන බැවින් උද්ධමනයේ වැඩිවීම දිගටම පවතිනු ඇතැයි අපේක්ෂා නොකෙරේ. ඒ අනුව, මතුපිට උද්ධමනය 2026 වසරේ තෙවන කාර්තුවේ සිට ක්‍රමානුකූලව පහත වැටෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගවල සහාය ඇතිව, මැදි කාලීනව සියයට 5ක ඉලක්කගත මට්ටම වටා උද්ධමනය ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

උද්ධමනයේ සංරචක සලකා බලන විට, යටිදැරි ඉල්ලුම් පීඩන හඳුනා ගැනීමට උපකාරී වන නිතර මිල උච්චාවචන සහිත භාණ්ඩ හා සේවා ඉවත් කිරීමෙන් මනිනු ලබන මූලික උද්ධමනය මැදි කාලීනව සමස්තයක් ලෙස ස්ථායීව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මතුපිට උද්ධමනයට මෙන්ම, 2024 වසරේ ජනවාරි මාසයේ දී ක්‍රියාත්මක වූ එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් මූලික උද්ධමනයට අදාළ භාණ්ඩ පැසෙහි බොහෝ අයිතමවල වියදම් ඉහළ ගිය බැවින් 2025 වසරේ පළමු කාර්තුවේ දී පදනම් බලපෑම මූලික උද්ධමනයට ද බලපානු ඇත. ඒ අනුව, මූලික උද්ධමනයේ 2025 වසරේ පළමු කාර්තුවේ දී තාවකාලික පහළ යෑමක් අපේක්ෂා කළ ද, ඉන් අනතුරුව අඩු උච්චාවචනයක් සහිතව මතුපිට උද්ධමනයේ ඉලක්කයට අනුකූලව යථා තත්ත්වයට පත්වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

02 රූප සටහන: මූලික උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

උද්ධමන ව්‍යාප්ති සටහනෙහි 2022 වසරේ සිව්වන කාර්තුව දක්වා වාර්තා කරන ලද දත්ත කො.පා.මි.ද. (2013=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද (seasonally adjusted)) මත පදනම් වන අතර මෙම කාල සීමාවෙන් පසු දත්ත කො.පා.මි.ද. (2021=100, සෘතුමය වශයෙන් ඇතිවන බලපෑම් ඉවත් කරන ලද) මත පදනම් වේ.

ඉහත 01 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

මතුපිට උද්ධමනය පහළ යෑමට උපකාරී වන බලශක්ති සහ ප්‍රවාහන ආශ්‍රිත කාණ්ඩයේ අයිතම මූලික උද්ධමන දර්ශකය බොහෝ දුරට බැහැර කරන බැවින්, මතුපිට උද්ධමනයේ මෑත කාලීන අඩුවීම ඒ ආකාරයෙන් ම මූලික උද්ධමනයෙන් පිළිබිඹු නොවේ. මේ අතර, මූලික උද්ධමනයට ද අර්ධ වශයෙන් ගෝලීය ආහාර මිල සහ විනිමය අනුපාතිකයේ හැසිරීම බලපානු ලැබේ.

03 රූප සටහන: මතුපිට උද්ධමනය: මිලෙහි ගතික බලපෑම හා පදනම් බලපෑම[4] (කො.පා.මි.ද., 2021=100)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

නුදුරු කාලීනව මතුපිට වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයට සෘණාත්මකව දායක වෙමින්, බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය අඩු මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, බලශක්ති සහ ප්‍රවාහන ආශ්‍රිත මිල ගණන්වල ක්‍රමානුකූල යථා තත්ත්වයට පත්වීමක් පුරෝකථනය කෙරේ. බලශක්ති සහ ප්‍රවාහන උද්ධමනය දැනට පවතින අඩු මට්ටම්වල සිට යථා තත්ත්වයට පත්වීම සඳහා දායක වනු ඇත. අස්ථාවර ගෝලීය මිල ගණන් මෙන්ම, ශ්‍රී ලංකා රුපියලෙහි හැසිරීම මගින් බලශක්ති සහ ප්‍රවාහන අංශවලට අදාළ දේශීය මිල ගණන් මත යම් ඉහළ පීඩනයක් ඇති කළ හැකි අතර, ඉදිරි සංශෝධන වාරවල දී ද විදුලි ගාස්තු සංශෝධන මගින් මෙම පුරෝකථනය කරන ලද මාර්ගයට බලපෑම් ඇති කරනු ඇත. කෙසේ වෙතත්, මෑත මාසවල ගෝලීය බනිජතෙල් මිලෙහි අස්ථායී හැසිරීම් සහ අවිනිශ්චිත කාලගුණික විපර්යාස හේතුවෙන් විදුලි ජනන සංයුතියේ පවතින

[4] උද්ධමනය සාමාන්‍යයෙන් මනිනු ලබන්නේ මිල මට්ටමේ වාර්ෂික ලක්ෂ්‍යමය වෙනසක් ලෙසය. එනම්, පෙර වසරේ අදාළ කාලපරිච්ඡේදයට සාපේක්ෂව මිල දර්ශකයකින් මනිනු ලබන, දී ඇති කාලපරිච්ඡේදය සඳහා වූ මිල මට්ටමේ ප්‍රතිශත වෙනස් වීමයි. (ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ගත් කළ, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ උද්ධමනය මැනීමට භාවිතා කරන ප්‍රධාන මිල දර්ශක දෙක වන කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. සම්පාදනය කර ප්‍රකාශයට පත් කරයි.) කෙසේ වෙතත්, මිල තොරතුරු සාමාන්‍යයෙන් මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබයි. එබැවින්, මාසිකව ද ලක්ෂ්‍යමය පදනමින් මිල වෙනස් වීම් ගණනය කළ හැකිය. එක් මාසයක සිට ඊළඟ මාසය දක්වා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස් වීම වත්මන් මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනයෙන් පෙර වසරේ අනුරූප මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය අඩු කිරීමෙන් දළ වශයෙන් ගණනය කළ හැකිය. (ප්‍රතිශත වෙනස්වීමට ලඝු වෙනස්වීම් ආසන්න වශයෙන් සමාන වීම මෙම ආසන්න කිරීම භාවිතා කිරීමට හේතුවේ.) ඒ අනුව, වත්මන් මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනය සාමාන්‍යයෙන් ගතිකතාව ලෙස හඳුන්වනු ලබන අතර, එය ආර්ථික ප්‍රවණතා හේතුවෙන් නවතම මාසයේ වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වෙනස් වන ආකාරය නිරූපණය කරයි. මේ අතර, පෙර වසරේ අනුරූප මාසයේ මාසික ලක්ෂ්‍යමය උද්ධමනයේ සෘණ අගය පදනම් බලපෑම ලෙස හැඳින්වෙන අතර, එයින් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය එක් මාසයක සිට ඊළඟ මාසය දක්වා වෙනස් වන ආකාරය කෙරෙහි බලපාන සංඛ්‍යානමය බලපෑම පිළිබිඹු වේ. (එනම්, π_t ^{වාර්ෂික ලක්ෂ්‍යමය} ≈ π_{t-1} වාර්ෂික ලක්ෂ්‍යමය + ගතිකතාව + පදනම් බලපෑම; මෙහි π මගින් උද්ධමනය නිරූපණය කරයි). මෙම වෙන් කිරීම ලක්ෂ්‍යමය උද්ධමනයේ වෙනස්වීම්වලට හේතු සාධක ඇගයීමට විශ්ලේෂකයින්ට ඉඩ සලසයි. මහ බැංකුවේ කාර්තුමය පුරෝකථන ආකෘතියෙන් ලබා දෙන පුරෝකථන වැනි කාර්තුමය තොරතුරු භාවිතා කරන විට, ගතිකතාව සහ පදනම් බලපෑම වශයෙන් වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය වර්ගීකරණය කිරීම, කාර්තුමය ලක්ෂ්‍යමය උද්ධමනය භාවිතයෙන් ද කළ හැකිය. තවද, මෙම ආසන්න කිරීම උද්ධමනයට පමණක් සීමා නොවන අතර ඕනෑම විචල්‍යයක වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස්කම් වෙන් කිරීමට යොදා ගත හැකිය.

අවිනිශ්චිතතාවය නිසා, ඉහත පුරෝකථන හා සම්බන්ධ අවිනිශ්චිතතාවය අතිශයින් ඉහළය. මීට අමතරව, සැපයුම් අංශයේ සාධක විශාල වශයෙන් දායක වන නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ උද්ධමනය නුදුරු කාලීනව තරමක් ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම 2024 වසරේ සිව්වන කාර්තුවෙහි කෘෂිකර්ම අංශයේ අපේක්ෂිත අඩු කාර්යසාධනය හේතුවෙන්, නුදුරු කාලීනව අපේක්ෂා කරන අඩු කෘෂිකාර්මික නිමැවුම් ද මේ සඳහා හේතු වේ.

විශේෂ සටහන (අ): උද්ධමන ව්‍යාප්ති සටහන පිළිබඳ හැඳින්වීමක්§

උද්ධමන ව්‍යාප්ති සටහන යනු පුරෝකථනය හා සම්බන්ධ අවිනිශ්චිතතා විදහා දක්වමින් උද්ධමන පුරෝකථන සන්නිවේදනය කිරීමේ ක්‍රමයකි. පොදුවේ ගත් කළ, නුදුරු කාලීන පුරෝකථනවලට වඩා ඉදිරි කාලය පිළිබඳ පුරෝකථන වඩාත් අවිනිශ්චිත වේ. එබැවින්, ව්‍යාප්ති සටහනේ පුරෝකථන කාල සීමාව වැඩිවත්ම ක්‍රමයෙන් පුළුල් වන විශ්වාස ප්‍රාන්තර ව්‍යාප්ති සටහන්වල සාමාන්‍ය ලක්ෂණයක් වේ. සාමාන්‍යයෙන්, ව්‍යාප්ති සටහන්වල මෑත අතීතයේ වාර්තා කරන ලද තොරතුරු ද තරමක් දුරට ඇතුළත් වේ. බොහෝ මහ බැංකු සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබඳ සිය පුරෝකථන පාර්ශ්වකරුවන් වෙත ප්‍රකාශ කිරීම සඳහා සන්නිවේදන මෙවලමක් ලෙස ව්‍යාප්ති සටහන් භාවිත කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව මතුපිට උද්ධමනයේ පුරෝකථන මාර්ගය දක්වමින් උද්ධමන ව්‍යාප්ති සටහන නිරන්තරයෙන් ප්‍රකාශයට පත් කරන අතර, එම ව්‍යාප්ති සටහන සෑම මුදල් ප්‍රතිපත්ති වාරයක දී ම යාවත්කාලීන කෙරේ. අනෙකුත් ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන්ද ඇතුළුව මැදි කාලීන උද්ධමන පුරෝකථන සිදු කිරීම සඳහා මහ බැංකුව අර්ධ ව්‍යුහාත්මක සාර්ව ආර්ථික ආකෘතියක් භාවිත කරයි. වාර්තා කරන ලද දත්ත, ප්‍රධාන ගෝලීය දර්ශකවල පුරෝකථන, තෝරාගත් විචල්‍යවල නුදුරු කාලීන පුරෝකථන, සහ විනිශ්චයන් භාවිතයෙන් පුරෝකථන සිදු කෙරේ.

උද්ධමන ව්‍යාප්ති සටහන සලකා බලන විට, සියයට 50, සියයට 70 සහ සියයට 90 විශ්වාස ප්‍රාන්තර, ක්‍රමයෙන් වර්ණය අඩු වන පරාස ලෙස මහ බැංකුව ප්‍රකාශයට පත් කරයි. පුරෝකථන කාලසීමාවේ පවතින තොරතුරු අනුව, ඉදිරියේ දී වාර්තා වන උද්ධමනයේ පැවතිය හැකි අගයන් නිරූපණය කිරීමක් ලෙස මෙම විශ්වාස ප්‍රාන්තර අර්ථ දැක්විය හැකි ය. උදාහරණයක් ලෙස, 2025 වසරේ ජනවාරි මාසයේ පුරෝකථන වාරයේ දී ගෙනහැර දැක්වූ උද්ධමන ව්‍යාප්ති සටහන අ.1 රූප සටහන මගින් නිරූපණය කෙරේ. එම පුරෝකථන වාරයේ දී සියයට 50ක ඉඩ ප්‍රස්තාවක් සහිතව උද්ධමනයේ වාර්තා විය හැකි අගයන් පැවතිය හැකි පරාසය මෙම ව්‍යාප්ති සටහනේ සියයට 50 විශ්වාස ප්‍රාන්තරය මගින් නිරූපණය කරයි.

අ.1 රූප සටහන: උද්ධමන ව්‍යාප්ති සටහනක ප්‍රධාන සංරචක
මතුපිට උද්ධමනයේ පුරෝකථනය (කාර්තුමය, කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

§ වඩාත් සවිස්තරාත්මක විස්තරයක් සඳහා, මහ බැංකු වෙබ් අඩවිය හරහා ප්‍රවේශ විය හැකි "ABCs of the Inflation Fan Chart", පිළිබඳ තොරතුරු මාලාවේ ලිපිය වෙත යොමු වන්න.

උද්ධමන අපේක්ෂා

මහ බැංකුවේ උද්ධමන අපේක්ෂා සමීක්ෂණයට අනුව, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දක්නට ලැබුණු අවධමනයේ සුළු අඩුවීමට සමගාමීව, 2025 වසරේ ජනවාරි සමීක්ෂණ වාරය තුළ ආයතනික අංශයේ උද්ධමන අපේක්ෂා බොහෝ කාල සීමාවන් සඳහා පෙර මාසයේ උද්ධමන අපේක්ෂාවන්ට සාපේක්ෂව වැඩි විය. මේ අතර, 2025 වසරේ ජනවාරි සමීක්ෂණ වාරයට අනුව, අපේක්ෂිත රජයේ වියදම් සහ වැටුප් වැඩිවීම, පුද්ගලික භාවිත වාහන ආනයන තහනම ලිහිල් කිරීමත් සමඟ රුපියල අවප්‍රමාණය වීම, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ඉහළ යෑම සහ උත්සව මාසවල ඉහළ ඉල්ලුම හේතුවෙන් ඉදිරි මාස 3 සිට දිගු කාල සීමා දක්වා අපේක්ෂිත උද්ධමනය ක්‍රමානුකූලව ඉහළ යෑමක් නිරීක්ෂණය කළ හැකි විය. කෙසේ වෙතත්, වත්මන් අවධමන තත්ත්ව පිළිබිඹු කරමින් සියලු කාලසීමාවන් සඳහා උද්ධමන අපේක්ෂා මට්ටම සියයට 5ක උද්ධමන ඉලක්කයට වඩා පහළින් පවතී.

මූර්ත ආර්ථික වර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම

පවතින දර්ශක, සමීක්ෂණ ප්‍රතිඵල සහ කාර්යමණ්ඩල ඇගයීම් මත පදනම්ව, 2024 වසරේ පළමු කාර්තු තුනෙහි නිරීක්ෂණය කරන ලද ධනාත්මක වර්ධනය අඛණ්ඩව පවත්වා ගනිමින් 2024 වසරේ සිව්වන කාර්තුවේ දී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්හි ධනාත්මක වර්ධනය මේ සඳහා දායක වී ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, 2024 වසර සඳහා වාර්ෂික ආර්ථික වර්ධනය සියයට 5ක් පමණ වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

නුදුරු කාලීන ආර්ථික වර්ධන පුරෝකථනය දළ දේශීය නිෂ්පාදිතයේ මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරයි. මූලික වශයෙන්, පෙර පුරෝකථන හා සසඳන විට, අඩු පොලී අනුපාතික මගින් රාජ්‍ය මූල්‍ය අවකාශය වැඩි වීම හරහා නුදුරු කාලීනව ආර්ථිකයේ කිසියම් ප්‍රසාරණාත්මක වර්ධනයක් ඇති කිරීමට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය උපකාරී විය හැකිය. තවද, රාජ්‍ය මූල්‍ය අවකාශය මගින් ඇතිවන ප්‍රසාරණාත්මක වර්ධනය හේතුවෙන් ධනාත්මක නිමැවුම් පරතරය තාවකාලිකව පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික වර්ධනයට අදාළ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ඇතුළත් නොවූ දැනට පවතින තොරතුරු මත පදනම්ව, ආර්ථිකය මැදි කාලීනව එහි සම්පූර්ණ ධාරිතා මට්ටමට වඩා අඩුවෙන් ක්‍රියාත්මක වනු ඇතැයි පුරෝකථනය කෙරේ.

දැඩි මූර්ත මුදල් තත්ත්වයන්ගේ අපේක්ෂිත ලිහිල් වීම හරහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම, පාරිභෝගික වියදම් ඉහළ නැංවීම සහ අවසානයේ සමස්ත ඉල්ලුම ඉහළ නැංවීම මගින් ආර්ථික වර්ධනය ඉහළ නැංවීම අපේක්ෂා කෙරේ. මේ අතර, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ ආර්ථිකයන්හි වර්ධන පුරෝකථන මගින් ඇතැම් ආර්ථිකයන් යළි යථා තත්ත්වයට පත් වීමක් පෙන්නුම් කරයි. එසේ වුවද, ධනාත්මක විදේශ නිමැවුම් පරතරය මැදි කාලීනව අඩු වී සෘණ මට්ටමකට පත්වෙනු ඇතැයි ඇස්තමේන්තු කර ඇති අතර, එමගින් විදේශීය ඉල්ලුම අඩු වීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, එක්සත් ජනපද වෙළඳාම සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස් වීම් ඉදිරි කාලපරිච්ඡේදය තුළ මෙම පුරෝකථනය කරන ලද මාර්ගය වෙනස් වීමට බලපානු ඇත. මීට අමතරව, දේශීය සේවා සඳහා, විශේෂයෙන් ම සංචාරක කර්මාන්තය සඳහා විදේශීය ඉල්ලුම ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පුරෝකථනය කරන ලද මැදි කාලීන ආර්ථික වර්ධන මාර්ගය සැලකිය යුතු අවිනිශ්චිතතාවයකට ලක්ව තිබීම අවධාරණය කළ යුතු කරුණකි. ඒ අනුව, දේශීය හා විදේශීය යන දෙඅංශයෙන් ම ඉතුරුම්වල සහාය දක්වන ආයෝජන ක්‍රියාකාරකම්වල තිරසාර වර්ධනයක්, පවතින ආර්ථික වර්ධන වේගය පවත්වා ගැනීම සඳහා තීරණාත්මක වනු ඇත. මේ අතර, මැදි කාලීනව ආර්ථිකයේ පූර්ණ විභව මට්ටම වෙත ළඟා වීම සඳහා සැලසුම් සහගත ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩව පවත්වා ගෙන යෑම අත්‍යාවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් ගත් කළ, ආර්ථිකයේ ඵලදායීතාව ඉහළ නැංවීම, අපනයන හැකියාව වැඩි කිරීම සහ ව්‍යුහාත්මක දුර්වලතා අවම කිරීම හරහා ආර්ථික වර්ධනයට ඇති බාධා අවම කිරීම ආර්ථිකයේ ඉහළ වර්ධනයක් තිරසාර පදනමකින් ළඟා කර ගැනීම සඳහා ප්‍රධාන වේ.

04 රූප සටහන: කාර්තුමය මූර්ත ද.දේ.නි.යේ වර්ධනයෙහි පුරෝකථන (වාර්ෂික ලක්ෂ්‍යමය, %)
***2025* වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ පුරෝකථන මත පදනම්ව**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

ඉහත 01 රූප සටහනෙහි පැහැදිලි කිරීමේ සටහන බලන්න.

2.2. පුරෝකථන සඳහා පාදක වන ප්‍රධාන උපකල්පන

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කරන ප්‍රධාන උපකල්පනවල සාරාංශයක් මෙම කොටසේ දක්වා ඇත.

ගෝලීය පරිසරය

Global Projections Model Network (GPMN)හි[5] පුරෝකථනයට අනුව, ලෝක ආර්ථිකය 2024 වසරේ දී සියයට 3.1කින් වර්ධනය වී ඇතැයි පුරෝකථනය කර ඇත. ගෝලීය වර්ධනයේ සුළු මන්දගාමීත්වයක් මැදි කාලීනව අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ආර්ථිකයේ අපේක්ෂිත යථා තත්ත්වයට පත්වීම හේතුවෙමින්, මෙම

[5] මහ බැංකුව මැදි කාලීන පුරෝකථන සිදු කිරීම සඳහා GPMN විසින් සකස් කරන ලද ගෝලීය සාර්ව ආර්ථික දර්ශකවල පුරෝකථන භාවිතා කරයි. 2025 වසරේ ජනවාරි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිතා කරන ලද පුරෝකථන පදනම් වී ඇත්තේ 2025 වසරේ ජනවාරි 21 වන දින GPMN විසින් ලබා දුන් මූලික පුරෝකථන මතය.

පුරෝකථන මත පදනම්ව ලබාගත් අපනයන අනුව බර තබන ලද විදේශීය නිමැවුම් පරතරය[6] නුදුරු කාලීනව ධන අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවද, එක්සත් ජනපදය, එක්සත් රාජධානිය හා යුරෝ කලාපීය ආර්ථිකයන්හි අපේක්ෂිත මන්දගාමීත්වය හේතුවෙන් මෙම නිමැවුම් පරතරය 2026 වසරේ මැද සිට ඍණාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. විශේෂයෙන් ම, සේවා අංශයේ අඛණ්ඩ උද්ධමනය හේතුවෙන්, බොහෝ ප්‍රධාන ආර්ථිකයන්හි මතුපිට උද්ධමනය මහ බැංකු ඉලක්කවලට වඩා ඉහළින් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. GPMN පුරෝකථනවලට අනුව, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුව 2025 වසරේ දී මුදල් ප්‍රතිපත්ති පොලී අනුපාතිකය අඩු කිරීමේ දී සුපරීක්ෂාකාරී ප්‍රවේශයක් අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. බ්‍රෙන්ට් බොරතෙල් මිලෙහි සාමාන්‍ය අගය පසුගිය වසරට සාපේක්ෂව 2025 වසරේ දී අඩු වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය 2026 වසරේ දී තවදුරටත් පහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මැදපෙරදිග සටන් විරාම ගිවිසුම, ඛනිජතෙල් අපනයනය කරන රටවල සංවිධානය (OPEC+) යටතේ නොපවතින ආර්ථිකයන් විසින් නිෂ්පාදනය වැඩි කිරීම සහ ගෝලීය ඉල්ලුම ලිහිල් වීමේ අපේක්ෂා ඉහත පුරෝකථන තහවුරු වීමට සහාය වේ. මේ අතර, ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආහාර මිල දර්ශකයේ සාමාන්‍යය 2024 වසරට වඩා ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කිරීමත් සමඟ ගෝලීය ආහාර මිල ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගෝලීය ආහාර මිල ගණන් ක්‍රමයෙන් ඉහළ යෑම සඳහා නියඟය සහ ගංවතුර වැනි කාලගුණය ආශ්‍රිත අවහිරතා නැවත නැවත ඇතිවීමේ අවදානම් හේතු වේ.

රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මග

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදල) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනට අනුකූලව පශ්චාත්-ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය මෙන්ම දැනට ක්‍රියාත්මක වන රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග මූලික පුරෝකථන සඳහා භාවිත කරන රාජ්‍ය මූල්‍ය ශේෂයන් තුළින් පිළිබිඹු වේ.

විදේශීය ජංගම ගිණුම

2024 සහ 2025 වසර සඳහා පිළිවෙළින් ජංගම ගිණුමේ ශක්තිමත් අතිරික්තයක් සහ සුළු ඍණාත්මක ශේෂයක් උපකල්පනය කර ඇත. මූලික පුරෝකථනවලට වඩා අඩු වෙළඳ හිඟයක්, සංචාරක ඉපැයීම්වල වැඩිදියුණු වීම සහ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම වත්මන් මුදල් ප්‍රතිපත්ති වාරයේ දී 2024 වසර සඳහා උපකල්පනය කරන ලද අතිරික්තය ඉහළ නැංවීමට හේතු විය. ප්‍රධාන වශයෙන්, වාහන ආනයනය නැවත ආරම්භ කිරීම හේතුවෙන් ඉහළ යනු ඇතැයි අපේක්ෂිත වෙළඳ හිඟය 2025 වසර සඳහා උපකල්පනය කරන ලද ජංගම ගිණුමේ හිඟයට හේතු වේ.

2.3. පුරෝකථන මත පවතින අවදානම්

උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය යන ද්විත්වයේ ම මූලික පුරෝකථන, පුරෝකථනය කරන ලද මට්ටම්වලට වඩා ඉහළ යෑම සඳහා මෙන්ම පහළ යෑම සඳහා ද අවදානම් පවතී. 2025 වසරේ ජනවාරි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරයට අනුව, එවැනි අවදානම් පිළිබඳ විවරණයක් මෙම කොටසේ දක්වා ඇත.

[6] ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් හය දෙනෙකුට අනුරූප වන සමස්ත අපනයනයේ ප්‍රමතකරණය කරන ලද අනුපාත භාවිතා කර GPMN පුරෝකථනයන්හි සපයා ඇති වෙළඳ හවුල්කරුවන්ගේ නිමැවුම් පරතරවල බරිත සාමාන්‍ය නිමැවුම් පරතරයක් ලෙස අපනයනය අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය ගණනය කෙරේ.

උද්ධමන පුරෝකථන මත පවතින අවදානම්

උද්ධමන පුරෝකථන පහළ යෑමේ අවදානම් සැලකූ විට, මෑතක දී ක්‍රියාත්මක කරන ලද බලශක්ති ආශ්‍රිත මිල අඩු කිරීම් මගින් අපේක්ෂිත මට්ටම්වලට වඩා ඉහළ වක්‍ර බලපෑම් ඇති වීමේ හේතුවෙන් උද්ධමනය පහළ යෑමට හැකිය. අපේක්ෂිත මිල සංශෝධනවල කාලය සහ ප්‍රමාණය අවිනිශ්චිත වුවද, මහජනතාවගේ ඉහළ ජීවන වියදම සඳහා සහනයක් ලබා දීමට නොයෙකුත් ක්‍රියාමාර්ග ගන්නා බවට ද රජය පොරොන්දු වී ඇත. එළඹෙන 2025 වසර සඳහා ජාතික අයවැය ප්‍රකාශනයෙන් පසුව පුරෝකථනය කරන ලද මාර්ගය සාක්ෂාත් කර ගැනීම පිළිබඳ යම් නිශ්චිතභාවයක් ලබා දෙනු ඇත. මෙම අතිරේක තොරතුරු ලබා ගත හැකි වූ වහාම ඉදිරි මුදල් ප්‍රතිපත්ති වාරයට එම තොරතුරු ඇතුළත් කෙරෙනු ඇත. මීට අමතරව, මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය හීන වීමේ දිගු කාලීන බලපෑම නිසා අපේක්ෂිත මට්ටම්වලට වඩා දිගු කාලයක් ඉල්ලුම් තත්ත්ව යටපත් වීම මගින් මිල පහළ යෑමේ පීඩන ඇති විය හැකිය.

පුරෝකථනය කරන ලද මාර්ගයට වඩා උද්ධමනය ඉහළ යෑමට හේතුවන අවදානම් ද ඇතිවිය හැකිය. විශේෂයෙන්, වැසි සහිත කාලගුණය අස්වැන්න නෙළන කාලය තුළ දිගටම පවතී නම්, අයහපත් කාලගුණික තත්ත්ව කෘෂිකාර්මික නිෂ්පාදනයට අහිතකර ලෙස බලපෑ හැකි අතර එමගින් ආහාර උද්ධමනය ඉහළ යෑමට හැකිය. තවද, මැදි කාලීනව, අනපේක්ෂිත කාලගුණික තත්ත්ව මගින් බලශක්ති උත්පාදනය සඳහා ජල විදුලිය මත යැපීම කෙරෙහි බලපෑ හැකි නිසා බලශක්ති මිල ඉහළ යෑමේ අවදානමක් ඇති කරයි. පෞද්ගලික අංශයේ වැටුප් වැඩි කිරීම හේතුවෙන් ව්‍යාපාර විසින් එවැනි වැඩිවන පිරිවැය පාරිභෝගිකයින් වෙත සම්ප්‍රේෂණය කිරීම හරහා තවදුරටත් මිල ගණන් ඉහළ යෑම සිදු විය හැකිය. මේ අතර, රාජ්‍ය වියදම් වැඩි වීම සිදුවුවහොත්, ඒ හරහා ඇති වන්නා වූ අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා මාර්ගයෙන් අපගමනය විය හැකි අවදානම උද්ධමන පීඩනයට ඇති වීමට හේතු විය හැකිය. එසේම අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයුමට අදාළ අවහිරතා අඛණ්ඩව පැවතියහොත් නුදුරු කාලීනව මිල ගණන් තව දුරටත් ඉහළ යා හැකිය. තවද, විදේශ විනිමය අනුපාතිකයෙහි සිදුවිය හැකි ඉහළ මට්ටමේ අවප්‍රමාණය වීමක් උද්ධමන පීඩන ඇති කිරීමට හේතු විය හැකිය. එක්සත් ජනපද ප්‍රතිපත්ති වෙනස්වීම් සමඟ, ආනයනික භාණ්ඩවල තීරුබදු වැඩිවීම් සහ ශ්‍රම වෙළඳපොළ දැඩි කළ හැකි ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග මගින් එක්සත් ජනපද උද්ධමනය මත ඉහළ අවදානම් වැඩි වී ඇත. තවද, ගෝලීය මිල ඉහළ යෑමේ යම් හැකියාවක් සහිතව ගෝලීය ආහාර හා බලශක්ති මිල පිළිබඳ වැඩි අවිනිශ්චිතතාවයක් පවතී. එවැනි අවදානම් ලෙස සැලකූ තත්ත්ව සැබවින්ම සිදු වුවහොත්, එමගින් ගෝලීය උද්ධමනයේ ඉදිරි දැක්ම කෙරෙහි වක්‍ර බලපෑම් ඇති වීම නිසා ඉහළ ආනයනික උද්ධමනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ උද්ධමන ඉදිරි දැක්ම මත අයහපත් බලපෑම් ඇති කළ හැකිය.

ආහාර උද්ධමනය කෙරෙහි අයහපත් කාලගුණයේ බලපෑම, ශ්‍රී ලංකා රුපියල මත විය හැකි අවප්‍රමාණය වීමේ පීඩනය සහ ඉහළ ගෝලීය අවිනිශ්චිතතා මධ්‍යයේ ගෝලීය ඛනිජතෙල් හා ආහාර මිලෙහි ඉහළ අස්ථාවරත්වය වැනි සාධක මගින් ඇති විය හැකි උද්ධමන පුරෝකථන ඉහළ යෑමේ අවදානම් සමඟ මෙතෙක් ක්‍රියාත්මක කර ඇති විදුලි ගාස්තු අඩු කිරීමේ වක්‍ර බලපෑම් මගින්, උද්ධමන පුරෝකථන සඳහා ඇති අවදානම් නුදුරු කාලීන සහ මැදි කාලීන යන දෙඅංශයේ ම තුලිතව පවතිනු ඇතැයි තක්සේරු කර ඇත.

ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම්

නුදුරු කාලයේ සිට මැදි කාලය දක්වා ඇති ආර්ථික පුරෝකථන පහළ යෑමේ ප්‍රධාන අවදානම් ලෙස, අනෙකුත් සාධක අතර, විදේශ රැකියා සඳහා ශ්‍රමිකයන් විශාල වශයෙන් පිටත්ව යෑම සහ වෘත්තිකයන්ගේ සංක්‍රමණය වීම නිසා පළපුරුදු පිරිස් අහිමි වීමෙන් ව්‍යාපාරවල ශ්‍රම බලකායේ හිඟයන් ඇතිවීම හේතුවෙන්, ඵලදායීතාවයේ අඛණ්ඩ පහත වැටීමක් ඇති කිරීමට මෙන්ම සමස්ත ආර්ථික නිමැවුමට බාධා ඇති කළ හැකිය. මීට අමතරව, කෘෂිකාර්මික නිෂ්පාදනය හා ආහාර සැකසුම් අංශ මෙන්ම විදුලි උත්පාදනය වැනි අංශ දේශගුණික විපර්යාසයන්වල බලපෑමට ලක් වීමේ වැඩි අවදානමක් ඇති බැවින්, මැදි කාලීනව, එවැනි සිදුවීම් ශ්‍රී ලංකාවේ ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය. මෙයට අමතරව, විදේශීය අංශයේ කාර්යසාධනය කෙරෙහි ගෝලීය අවිනිශ්චිතතා, විශේෂයෙන් එක්සත් ජනපදයේ දේශපාලන වෙනස්කම් හේතුවෙන් වන අවිනිශ්චිතතා බලපෑම් ඇති කළ හැකිය. ශ්‍රී ලංකාවේ විදේශ අංශයට තීරණාත්මක වන ගෝලීය වෙළඳාම, ආයෝජන, ප්‍රාග්ධන ප්‍රවාහ, ආර්ථික වර්ධනය සහ උද්ධමනය යන අංශයන්හි උච්චාවචන ඇති වීමට එක්සත් ජනපදයේ ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතු විය හැකිය.

ආර්ථික වර්ධනය, පුරෝකථනවලට වඩා ඉහළ යෑම සඳහා පවතින අවදානම් සැලකූ විට, ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව අවසන් කිරීමේ සහ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ දැමීමේ බලපෑම මගින් ආයෝජකයින්ගේ අපේක්ෂා වැඩි දියුණු වීම සහ ඇතැම් ණය සීමා ලිහිල් වීමේ හැකියාව තුළින් ආර්ථික වර්ධනය වේගවත් විය හැකිය. අයවැය හරහා තවමත් නිල වශයෙන් ඉදිරිපත් කර නොමැති ආර්ථික වර්ධනය ඉලක්ක කරගත් ප්‍රතිපත්ති රැසක් රජය විසින් පොරොන්දු වී ඇත. මෙම ප්‍රතිපත්ති සැලසුම් කළ පරිදි ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන්නේ නම්, ඒවා අනුරූප අංශවලට සෘජුවම සහාය විය හැකි අතර, ව්‍යාපාර පවත්වාගෙන යෑමේ වාතාවරණයේ සහ පරිපාලනයේ ඇති විය හැකි වැඩිදියුණු කිරීම් ආර්ථිකයේ වර්ධන විභවය වැඩි දියුණු කිරීමට උපකාරී වනු ඇත. තවද, සංචාරක කර්මාන්තය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල අපේක්ෂිත මට්ටමට වඩා වේගවත් වැඩි දියුණු වීම් ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීමට දායක විය හැකිය. මේ අතර, විශාල යටිතල පහසුකම් සංවර්ධනයන් ආශ්‍රිත ක්‍රියාකාරකම්වල වැඩි දියුණු වීමත් සමඟ, ආර්ථික ක්‍රියාකාරකම්වල ඉහළ යෑමක් දැකගත හැකි අතර එය ඉහළ ආර්ථික වර්ධනයකට මග පාදයි.

සමස්තයක් වශයෙන්, ආර්ථික වර්ධන පුරෝකථන මත පවතින අවදානම්, නුදුරු කාලීනව මෙන්ම මැදි කාලීනව තුලිතව පවතිනු ඇතැයි තක්සේරු කර ඇත. ආර්ථික වර්ධන පුරෝකථන සම්බන්ධයෙන් ඉහළ යෑම සඳහා ඇති අවදානම්වල බලපෑම, ආර්ථික වර්ධන පුරෝකථන සම්බන්ධයෙන් පහළ යෑම සඳහා ඇති අවදානම්වල බලපෑම මගින් අහෝසි වීම මෙවැනි තක්සේරුවක් කිරීමට හේතු විය.

05 රූප සටහන: පුරෝකථන මත ඇතිවන අවදානම් වල සමස්ත දිශානතිය



මූලය: මහ බැංකු කාර්යමණ්ඩල පුරෝකථන

2.4. පෙර පුරෝකථන සමඟ සැසඳීම[7]

මැදි කාලීන පුරෝකථන සඳහා භාවිත කළ ප්‍රධාන උපකල්පන

2025 වසරේ ජනවාරි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථන, 2024 වසරේ අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාව සඳහා භාවිත කරන ලද 2024 වසරේ ජූලි මාසයේ පැවති තොරතුරු සමඟ සසඳන විට, ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන්ගේ අපනයන අනුව බර තබන ලද විදේශ නිමැවුම් පරතරය පිළිබඳ ඉදිරි දැක්ම, නුදුරු කාලීනව වර්ධනය වී ඇති නමුත් මැදි කාලීනව පිරිහීමට ලක් වී ඇත. මෙම වෙනසට මූලික වශයෙන් හේතු වී ඇත්තේ එක්සත් ජනපදය, යුරෝ කලාපය සහ එක්සත් රාජධානියේ ආර්ථිකයන්ට අදාළ පුරෝකථන සංශෝධනය වීමයි. 2024 වසරේ ජූලි මාසයේ මුදල් ප්‍රතිපත්ති වාරය සමඟ සසඳන විට, 2025 වසරේ ජනවාරි මස පැවති මුදල් ප්‍රතිපත්ති වාරයේ දී භාවිත කරන ලද ගෝලීය පුරෝකථන මගින් ආහාර උද්ධමනයේ වඩා සැලකිය යුතු ඉහළ යෑමක් පුරෝකථනය කරයි. 2025 වසරේ දී ගෝලීය ආහාර උද්ධමනය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර ඉන්පසුව ස්ථායී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 ජූලි මාසයේ දී පුරෝකථනවලට සාපේක්ෂව ලෝක බනිජතෙල් මිල ගණන්වල පුරෝකථන සැලකිය යුතු ලෙස පහළ ගොස් ඇත. මේ අතර, එක්සත් ජනපද ෆෙඩරල් සංචිත බැංකුවේ සුපරික්ෂාකාරී ප්‍රවේශය මධ්‍යයේ, එක්සත් ජනපදයේ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම පෙර පුරෝකථනයට වඩා මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන්, 2024 වසර සඳහා, 2024 වසරේ ජූලි මුදල් ප්‍රතිපත්ති වාරයට සාපේක්ෂව වත්මන් පුරෝකථනවල රාජ්‍ය මූල්‍ය අංශයේ ගමන් මගෙහි සංශෝධන සිදුවී ඇත. 2024 වසර සඳහා පුරෝකථනය වන ඉහළ ආර්ථික

[7] මෙම කොටස මගින් 2024 අගෝස්තු මස මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ඉදිරිපත් කරන ලද, 2024 වසරේ ජූලි මස මුදල් ප්‍රතිපත්ති වාරයේ දී පැවති පුරෝකථනයට සාපේක්ෂව වත්මන් පුරෝකථන සංසන්දනය කෙරේ.

වර්ධනයක් මධ්‍යයේ රාජ්‍ය ආදායමේ වැඩිවීම හේතුවෙන්, 2024 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය ශේෂය පෙර පුරෝකථනවලට වඩා වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නව තොරතුරු පිළිබිඹු කිරීම ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ ශේෂය පිළිබඳ උපකල්පන කරමින් යාවත්කාලීන කර ඇත. ඒ අනුව, ප්‍රධාන වශයෙන්, 2024 වසරේ ආනයනයන්හි අපේක්ෂා කළ මට්ටමට වඩා අඩු ඉහළ යෑම හේතුවෙන් 2024 වසර සඳහා ජංගම ගිණුමේ අතිරික්තය, 2024 වසරේ ජූලි මාසයේ දී උපකල්පනය කළ මට්ටමට වඩා වැඩි වනු ඇතැයි පුරෝකථනය කර ඇත.

06 රූප සටහන: ගෝලීය පුරෝකථන (කාර්තුමය)



මූලයන්: කාර්තුමය පුරෝකථන ආකෘතිය, Global Projection Model Network (GPMN) (26/06/2024 සහ 21/01/2025 යාවත්කාලීන කිරීම්)

උද්ධමනයේ හැසිරීම

2024 වසරේ අගෝස්තු මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ ප්‍රකාශයට පත් කරන ලද පුරෝකථන හා සසඳන විට, 2024 වසරේ තුන්වන සහ හතරවන කාර්තු දෙකෙහි දී ම වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය පුරෝකථනය කළ මට්ටමට වඩා පහළ මට්ටමක පැවති අතර, ඒ සඳහා පෙර උපකල්පනය කළ මාර්ගයට සාපේක්ෂව වාර්තා වූ විදුලි ගාස්තු සංශෝධනවල අපගමනය මෙන්ම අඩු දේශීය ඉන්ධන මිල මට්ටම් සහ ජල ගාස්තුවල අඩු වීම හේතු විය. අනාගත විදුලි ගාස්තු සංශෝධන පිළිබඳ වූ සීමිත තොරතුරු මධ්‍යයේ, 2024 වසරේ ජූලි පුරෝකථන සඳහා විදුලි ගාස්තුවල සුළු වැඩිවීමක් 2024 වසරේ හතරවන කාර්තුවේ දී ක්‍රියාත්මක වනු ඇතැයි උපකල්පනය කරන ලදී. කෙසේ වෙතත්, එවැනි ගාස්තු වැඩි කිරීමක් සිදු නොවූ අතර, 2025 වසරේ ජනවාරි මාසයේ දී සැලකිය යුතු මට්ටමේ ගාස්තු පහළ දැමීමක් සිදු විය. ප්‍රධාන වශයෙන්, ජල ගාස්තු පහළ දැමීම හේතුවෙන්, 2024 වසරේ තුන්වන කාර්තුව සඳහා වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය පෙර පුරෝකථනයට වඩා සුළු වශයෙන් පහළ මට්ටමක පැවතුණි. 2024 වසරේ හතරවන කාර්තුවේ දී වාර්තා වූ උද්ධමනය කලින් පුරෝකථනය කළ මාර්ගයෙන් අපගමනය වීමට, අපේක්ෂිත විදුලි ගාස්තු වැඩිවීම සිදුනොවීම සහ ඉන්ධන මිල ගණන් ක්‍රමයෙන් පහළ දැමීම දායක විය. මීට අමතරව, 2024 වසරේ දී එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීමේ බලපෑම ද මෙම අපගමනයට දායක වී ඇති බවට ඇස්තමේන්තු කර ඇත. 2024 වසරේ පළමු කාර්තුවේ දී එකතු කළ අගය මත බදු නිසා ඇති වූ සංඛ්‍යාන පදනම් බලපෑම හේතුවෙන් 2025 වසරේ මුල් කාලයේ දී උද්ධමනයේ පෙර අපේක්ෂා කළ අඩු වීම වත්මන් පුරෝකථනවල ද පිළිබිඹු වේ. 2024 වසරේ ජූලි පුරෝකථනයට සමානව, අඛණ්ඩ බලශක්ති මිල අඩු කිරීම් හේතුවෙන් ඇති වූ අහිතකර පදනම් බලපෑම මගින්, 2025 වසරේ අග භාගයේ වාර්ෂික ලක්ෂ්‍යාමය මතුපිට උද්ධමනය ඉහළට යනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, වර්තමාන පුරෝකථන තුළ, අපේක්ෂිත උද්ධමන මාර්ගයේ උපරිම අගය අඩු විශාලත්වයකින් යුතුව ඉදිරියට විතැන් වී ඇති අතර, මේ සඳහා අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා අඩුවෙන් වාර්තා වූ උද්ධමනය සහ ප්‍රධාන වශයෙන් මෑතකාලීන විදුලි ගාස්තු සංශෝධන හේතුවෙන් නුදුරු කාලීන පුරෝකථන පහළ දැමීම් දායක වී ඇත. ඒ අතරම, පෙර පුරෝකථනවලට සමානව, උද්ධමනය මැදි කාලීනව උද්ධමන ඉලක්කය වටා ක්‍රමයෙන් ස්ථායී වනු ඇතැයි අපේක්ෂිතය.

3. වර්තමාන ආර්ථික තත්ත්වය

3.1. උද්ධමනය

2024 වසරේ දෙවන භාගය තුළ දී මතුපිට උද්ධමනය පහත වැටීමේ ප්‍රවණතාවක් වාර්තා කළ අතර, ප්‍රධාන වශයෙන් පාලිත මිල ගණන් අඩු කිරීම හේතුවෙන් එය 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට සෘණ අගයක පැවතුණි.

07 රූප සටහන: මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම (කො.පා.මි.ද., 2021=100)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100) පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 2024 වසරේ ජූලි මාසයේ දී වාර්තා වුණු සියයට 2.4ක අගයේ සිට සමස්තයක් ලෙස පහළ යාමේ ප්‍රවණතාවක් අනුගමනය කළේය. එය 2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට අඛණ්ඩව සෘණ අගයක පැවතුණි. 2024 වසරේ ජූලි මාසයේ දී විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස පහළ දමමින් සිදු කරන ලද සංශෝධන ඇතුළු ආහාර නොවන කාණ්ඩයේ මිල අඩුකිරීම්, ප්‍රධාන වශයෙන් මෙම අවධමන තත්ත්වය ඇති වීමට හේතු විය. මීට අමතරව, ගෘහස්ථ ඉන්ධන සහ එල්.පී. ගෑස් මිල ගණන් පහළ දමමින් කිහිපවරක් සිදු කෙරුණු සංශෝධන, 2024 වසරේ අගෝස්තු මාසයේ දී ජල ගාස්තු අඩු කරමින් සිදු කෙරුණු සංශෝධන, සහ ජූලි හා අගෝස්තු මාසවල බස් ගාස්තු පහළ දමමින් සිදු කළ සංශෝධන මෙන්ම, ආහාර මිල ගණන් අඩු වීම ද උද්ධමනය පහළ යෑමට හේතු විය. ඒ අනුව, 2024 වසරේ දෙසැම්බර් මාසය වන විට කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සියයට -1.7ක අගයක් වාර්තා කළේය.[8] 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය ආහාර උද්ධමනය සියයට 0.8ක ධන අගයක පැවති අතර, ආහාර නොවන උද්ධමනය සියයට -3.0ක සෘණ අගයක පැවතුණි. මේ අතර, ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100) මත පදනම් මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ද, 2024 වසරේ ජූලි මාසයේ වාර්තා වූ සියයට 2.5 සිට 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට -2.0ක් දක්වා පහළ ගියේය.

[8] 2025 ජනවාරි මාසයේ දී, කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සියයට -4.0 ලෙස වාර්තා විය.

08 රූප සටහන: වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො.පා.මි.ද.)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

කො.පා.මි.ද. පදනම් කරගත් මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, විදුලි ගාස්තු, ඉන්ධන මිල සහ ප්‍රවාහන වියදම් මෙන්ම ආහාර මිල අඩු වීම හේතුවෙන්, 2024 වසරේ මාස කිහිපයක් තුළ දී බොහෝ විට සෘණ අගයන්වල පැවතුණි.

09 රූප සටහන: මාසික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය සඳහා දායකත්වය (කො .පා.මි. ද.)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

ආර්ථිකයේ යටි දැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරන කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2024 වසරේ දෙවන භාගය තුළ දී සාමාන්‍යයෙන් අඩු මට්ටමක පැවති අතර, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 2.7ක් ලෙස වාර්තා විය.[9] මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය දෙසැම්බර් මාසයේ දී සියයට 1.3ක් ලෙස වාර්තා විය.

[9] 2025 ජනවාරි මාසයේ දී, කො.පා.මි.ද. පදනම් කරගත් වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය සියයට 1.2ක් ලෙස වාර්තා විය.

කො.පා.මි.ද. මත පදනම් වූ කාර්තුමය මතුපිට උද්ධමනය, මුදල් ප්‍රතිපත්ති රාමුව පිළිබඳ ගිවිසුමෙහි දක්වා ඇති උද්ධමන ඉලක්කයට ප්‍රතිශතාංක ±2ක ආන්තිකයෙන් අපගමනය වෙමින්, 2024 වසරේ දෙවන සහ තුන්වන කාර්තුවල දී කාර්තු දෙකක් අඛණ්ඩව අඩු මට්ටමක පැවතීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ 26(5) වගන්තියට අනුව ගරු මුදල් අමාත්‍යවරයා හරහා පාර්ලිමේන්තුව වෙත වාර්තාවක් ඉදිරිපත් කරන ලදී. පසුව, එම වාර්තාවේ අන්තර්ගතය රාජ්‍ය මුදල් පිළිබඳ කාරක සභාවේ දී සවිස්තරාත්මකව සාකච්ඡා කෙරුණු අතර, එම වාර්තාව සඳහා මහජනතාවට ද ප්‍රවේශය ලබා දෙන ලදී.[10] කාර්තුමය මතුපිට උද්ධමනය 2024 වසරේ සිව්වන කාර්තුවේ දී ද උද්ධමන ඉලක්කයට සියයට 2කට වඩා පහළින් පැවති බැවින් මහ බැංකු පනතේ 26(5) වගන්තියට අනුව පසු විපරම් වාර්තාවක් ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබේ.

පවතින තොරතුරුවලට අනුව,[11] 2024 වසර තුළ දී, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) යන ද්විත්වය ම ඉහළ යෑමක් වාර්තා කළේය.

2023 වසරේ දී නිරීක්ෂණය කරන ලද නාමික වැටුප්වල ඉහළ යාමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින්, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය 2024 දී සමස්ත වැඩිවීමක් වාර්තා කළේය. මෙම වැඩිවීම ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් තුන තුළ ම නිරීක්ෂණය වූ අතර, සේවා ක්‍රියාකාරකම් ඉහළම වැටුප් වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යාමය වර්ධනය 2023 හා සසඳන විට 2024 වසර තුළ දී උද්ධමන පීඩනය ලිහිල් වීමට අනුකූලව මන්දගාමී විය. එපමණක් නොව, උද්ධමනය අඛණ්ඩව අඩුවීමත් සමඟ අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත වර්ධනය අඛණ්ඩව තව දුරටත් වේගවත් විය.

2024 වසරේ ජනවාරි සහ අප්‍රේල් මාසවල රාජ්‍ය අංශයේ සේවකයන්ගේ ජීවන වියදම් දීමනාව ඉහළ දැමීමත් සමඟ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය 2024 වසර තුළ දී ඉහළ ගියේය. මේ අතර උද්ධමනය අඩුවීම හේතුවෙන් මූර්ත වැටුප් පහත වැටීම පාලනය වී ඇත.

10 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ (2018=100) සහ රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ වෙනස්වීම් (2016=100)



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

[10] 2024 වසරේ දෙවන සහ තුන්වන කාර්තුව සඳහා උද්ධමන ඉලක්කයෙන් මතුපිට උද්ධමනය අපගමනය වීම පිළිබඳ වාර්තාව

[11] මෙම කොටසේ දත්ත, මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) සහ අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මත පදනම් වේ.

විශේෂ සටහන (ආ): ශ්‍රී ලංකාවේ වත්මන් අවධමන තත්ත්වයට බලපාන මිල ප්‍රවණතා සහ මහජන අදහස්

2025 වසරේ ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාව අඛණ්ඩව පස්වන මාසයටත් අවධමන තත්ත්වයක් අත් දකිමින්, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) සෘණ අගයක පැවතුණි. පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සංසන්දනය කිරීමේ දී, පාරිභෝගික මිල දර්ශකයක් මගින් මනිනු ලබන ආර්ථිකයේ සමස්ත මිල මට්ටමේ පහළ යෑම, අවධමනය මගින් නිරූපණය වේ. සමස්ත මිල මට්ටම මගින් නිරූපණය වනුයේ, සාමාන්‍ය ගෘහයක් විසින් පරිභෝජනය කරන භාණ්ඩ හා සේවාවල මිල ගණන් පරිභෝජන චර්යා මත පදනම්ව බර තැබූ සාමාන්‍යයකි. කෙසේ වෙතත්, සමස්ත මිල මට්ටමේ පහත වැටීමක් මගින් පරිභෝජනය කරන සියලුම භාණ්ඩ හා සේවාවල මිල අඩුවීමක් අදහස් නොවේ. සාමාන්‍යයෙන්, භාණ්ඩ හා සේවා යම් කාලපරිච්ඡේදයක් තුළ මිල වෙනස්වීම් පෙන්නුම් කළ හැකිය. සමහර මිල ගණන් වැඩි විය හැකි අතර, අනෙක්වා නොවෙනස්ව පැවතීමට හෝ පහත වැටීමට හෝ හැකිය. යම් කාලපරිච්ඡේදයක් තුළ මිල පහත වැටීම්වල සමස්ත බලපෑම ඉහළ යන මිල ගණන්වල බලපෑම ඉක්මවා ගිය විට අවධමනය ඇති වන අතර එමගින් සමස්ත මිල මට්ටමේ අඩුවීමක් සිදු වේ.

2025 වසරේ ජනවාරි මාසයේ දී, කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය) සියයට -4.0ක් (සියයට 4.0ක අවධමනයක්) ලෙස වාර්තා විය. මෙයින් පෙන්නුම් කරනු ලබන්නේ, කො.පා.මි.ද. මත පදනම්ව මනිනු ලබන සමස්ත මිල මට්ටම, පසුගිය වසරේ එම කාල සීමාවට සාපේක්ෂව පහත වැටී ඇති බවයි. කෙසේ වෙතත්, ඉහත සඳහන් කළ පරිදි, සියලු මිල ගණන් පහත වැටී නොමැත. සමස්ත මිල මට්ටම පහත වැටී ඇතත්, ඇතැම් භාණ්ඩ හා සේවාවල මිල ඉහළ ගොස් ඇත. කො.පා.මි.ද.යේ පහත වැටීමෙන් පිළිබිඹු වනුයේ, පසුගිය වසර තුළ ඇතැම් අයිතමවල මිල පහත වැටීමේ සමස්ත බලපෑම, අනෙකුත් භාණ්ඩවල මිල ඉහළ යෑමේ බලපෑම ඉක්මවා ගොස් ඇති බවයි.

ආ.1 රූප සටහන: කාණ්ඩ අනුව වර්ගීකරණය කරන ලද මතුපිට උද්ධමනය - 2025 වසරේ ජනවාරි මාසය (කො.පා.මි.ද. මත පදනම්ව, වාර්ෂික ලක්ෂ්‍යමය, %)



සටහන: පදනම් බරිත අගයන් වරහන් තුළ දක්වා ඇත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

2025 වසරේ ජනවාරි මාසයේ දී කො.පා.මි.ද.හි ප්‍රධාන කාණ්ඩවල වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මිල වෙනස්වීම් ආ.1 රූප සටහන මගින් නිරූපණය කෙරේ. ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග;[§] ආපනශාලා සහ හෝටල්; නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන කාණ්ඩවල ශුද්ධ පදනම මත මිල පහළයෑම් වාර්තා වූ අතර, අනෙකුත් කාණ්ඩවල මිල ඉහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වෙතත්, මිල පහළ යෑම්වල බලපෑම අනෙකුත් මිල ඉහළ යෑම්වල බලපෑමට වඩා වැඩි බව පෙන්නුම් කරමින් එහි ශුද්ධ බලපෑම කො.පා.මි.ද.හි සමස්ත පහළ යෑමකට තුඩු දී ඇත. තවද, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පරිදි, 2024 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2025 වසරේ ජනවාරි මාසයේ කො.පා.මි.ද.හි ප්‍රධාන කාණ්ඩවල මාසික ගෘහ ඒකක වියදමෙහි වෙනස්වීම මගින් මෙය නැවතත් තහවුරු කෙරේ.

[§] අදාළ කාල සීමාව තුළ දී ඇතැම් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් පහළ ගොස් ඇති අතර, වෙනත් ඇතැම් ආහාර ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ ගොස් ඇත. සමස්ත බලපෑම වූයේ ආහාර කාණ්ඩය යටතේ මුළු වියදම් අඩුවීමයි.

ආ.2 රූපසටහන: 2024 වසරේ ජනවාරි මස සිට 2025 වසරේ ජනවාරි මස දක්වා ගෘහ ඒකක වියදම පහළ යෑමට දායකත්වය (කො.පා.මි.ද මත පදනම් වූ, රු.)



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

* මෙයින් අදහස් කරන්නේ 2024 ජනවාරි මාසයට සාපේක්ෂව **2025 වසරේ ජනවාරි මාසයේ** සාමාන්‍ය ගෘහයක වියදම රු. 7,490කින් අඩු වී ඇති බව වන අතර, එය 2025 ජනවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත -4.0ක උද්ධමනයට අනුරූප වේ.

සටහන: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ගෘහ වියදම්වල වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙනස් වීම www.statistics.gov.lk/InflationAndPrices/StaticalInformation/MonthlyCCPI/CCPI_20250131E. ඔස්සේ ලබා ගත හැකිය.

2024 වසරේ ජනවාරි මාසයට සාපේක්ෂව 2025 වසරේ ජනවාරි මාසය තුළ සමස්ත ගෘහ ඒකක වියදම අඩු කිරීම සඳහා විවිධ කාණ්ඩවලින් ලද දායකත්වය ආ.2 රූප සටහන මගින් නිරූපණය කෙරේ. මෙම රූප සටහන මගින්, අනෙකුත් කාණ්ඩවල වියදම් වැඩිවීම අභිබවා යමින්, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග; සහ ප්‍රවාහන කාණ්ඩ මගින් ගෘහ ඒකක වියදම අඩු කිරීම සඳහා විශාලම දායකත්වය සපයා ඇති ආකාරය නිරූපණය කෙරෙන අතර, එමගින් පෙර වසරේ එම මාසයට සාපේක්ෂව සමස්ත ගෘහ ඒකක වියදමෙහි පහළ යෑමක් සිදු වී ඇත. මිල විචලනයන් මධ්‍යයේ කො.පා.මි.ද.හි ඇතැම් කාණ්ඩවල ගෘහ ඒකක වියදම පහළ යෑම පිළිබඳ වැඩිදුර විස්තර සැපයීම සඳහා, ආ.1 සංඛ්‍යා සටහන මගින් ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග; නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන; සහ ප්‍රවාහන යන කාණ්ඩවල තෝරාගත් අයිතමවල වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වියදම් පහළ යෑම් ඉදිරිපත් කරයි.

ආ.1 සංඛ්‍යා සටහන: 2024 ජනවාරි මාසයට සාපේක්ෂව 2025 ජනවාරි මාසයේ දී තෝරාගත් අයිතම කාණ්ඩවල මාසික ගෘහ ඒකක වියදම් වෙනස් වීම (කො.පා.මි.ද. මත පදනම් වූ, රු.)

කාණ්ඩය/අයිතමය	වෙනස (රු.)	උද්ධමනය සඳහා දායකත්වය (%)	
නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන	**-6,794.18**	**-3.68**	
එයින් නිවාස කුලිය	145.93	0.08	+
ජල බිල	-240.98	-0.13	
විදුලි බිල	-6,432.42	-3.49	-
එල්.පී.ගෑස්	-271.07	-0.15	
ආහාර සහ මද්‍යසාර නොවන පාන වර්ග	**-1,544.77**	**-0.83**	
එයින් සහල්	666.66	0.36	
පොල්	1,537.81	0.83	+
පොල් තෙල්	297.65	0.16	
පාන් (සාමාන්‍ය)	-137.44	-0.07	
කුකුල් මස්	-292.76	-0.16	
ටින් මාළු	-349.53	-0.19	
නැවුම් පලතුරු	-376.99	-0.20	
එළවළු	-1,450.60	-0.79	-
ලොකු ළූණු	-788.10	-0.43	
සීනි	-178.08	-0.10	
මිරිස් කුඩු	-139.71	-0.08	
වියළි මිරිස්	-180.26	-0.10	
ප්‍රවාහන	**-925.97**	**-0.50**	
එයින් වාහන නඩත්තු වියදම්	201.39	0.11	+
පෙට්‍රල්	-1,210.61	-0.66	
ඩීසල්	-200.51	-0.11	-
බස් ගාස්තු	-187.93	-0.10	

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

සටහන: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද ගෘහ වියදම්වල වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වෙනස් වීම www.statistics.gov.lk/InflationAndPrices/StaticalInformation/MonthlyCCPI/CCPI_20250131E ඔස්සේ ලබා ගත හැකිය.

ආ.3 රූප සටහන: කො.පා.මි.ද.හි වෙනස්වීම සහ උද්ධමනය



මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පසුගිය මාස කිහිපය තුළ අවධමන තත්ත්වයක් පැවතිය ද, එය ජීවන වියදමේ සහනයක් ලෙස පිළිබිඹු නොවන බව ඇතැම් කොටස් පවසයි. දැනටමත් ඉහළ ගොස් ඇති මිල මට්ටම් මේ සඳහා එක් හේතුවක් විය හැකිය. සමස්ත මිල මට්ටම ඉහළ යෑමේ වේගය මාස කිහිපයක් පුරා අඩු වී සෘණ අගයක් ගෙන ඇතත්, ආ.3 රූප සටහනෙහි පෙන්වා ඇති පරිදි 2022 වසරට පෙර පැවති මට්ටම්වලට සාපේක්ෂව සමස්ත මිල මට්ටම සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. කො.පා.මි.ද. සාමාන්‍ය ගෘහ ඒකකයක මුළු මාසික වියදම් නියෝජනය කරයි. එබැවින්, කො.පා.මි.ද. ඉහළ මට්ටම්වල පැවතීම මගින් මාසික ගෘහ වියදම් සාමාන්‍යයෙන් තවමත් ඉහළ මට්ටමක පවතින බව පෙන්නුම් කරයි. එපමණක් නොව, ජනගහනයේ බොහෝ කොටස්වල ආදායම් මට්ටම්, අතීත උද්ධමනකාරී තත්ත්වයන්හි බලපෑමට පූර්ණ ලෙස ගැළපී තිබීමට ඇති ඉඩකඩ අඩුය. වැටුප් ප්‍රමාණ දර්ශකවලට සාපේක්ෂව කො.පා.මි.ද.හි වැඩිවීම සංසන්දනය කෙරෙන ආ.4 වන රූප සටහනෙහි මෙය පැහැදිලිව දක්නට ලැබේ. එබැවින්, පසුගිය වසර කිහිපය තුළ සිය මූර්ත ආදායම් මට්ටම් ක්‍රමයෙන් අඩු වූ පරිසරයක් තුළ, මෑත මාසවල නිරීක්ෂණය කරන ලද මුළු මාසික වියදම්වල සුළු අඩුවීම මගින් ගෘහ ඒකකවලට සැලකිය යුතු සහනයක් නොලැබීමට ඉඩ ඇත.

ආ.4 රූප සටහන: කො.පා.මි.ද. සහ වැටුප් ප්‍රමාණ දර්ශකවල වෙනස්වීම (2022 වසරේ ජනවාරි මස අගය 100 දක්වා සාමාන්‍යකරණය කරන ලද)



මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව

මීට අමතරව, ප්‍රකාශයට පත් කරන ලද උද්ධමනයට වඩා පුද්ගලයෙකුට දැනෙන උද්ධමනය වෙනස් වීමට මනෝවිද්‍යාත්මක සහ චර්යා රටාවල ස්වභාවය හේතු විය හැකිය. පර්යේෂණවලින් පෙන්නුම් කරන පරිදි, මුළු වියදමින් වෙන් කෙරෙන කොටස කෙසේ වුවත්, නිතර මිලදී නොගන්නා අයිතමවල මිල වෙනස්වීම්වලට වඩා නිතර මිලදී ගන්නා අයිතමවල මිල වෙනස්වීම පුද්ගලයෙකුට දැනෙන උද්ධමනයට බලපෑම් සිදු කරන බවයි (උදා: D’Acunto et al. (2021) සහ Georganas et al. (2014)). ශ්‍රී ලංකාවේ විදුලි ගාස්තු සැලකිය යුතු ලෙස අඩු කර ඇති වුවද විදුලි බිල්පත මසකට වරක් ගෙවනු ලැබේ. අනෙක් අතට, සහල් සහ පොල් මිල ඉහළ ගොස් ඇති අතර, එම අයිතම මසකට කිහිපවතාවක් නිතර මිලදී ගනු ලැබේ. එබැවින් විදුලි ගාස්තු අඩුවීම නිසා සිදු වන ඉතිරිය, වැඩි වූ සහල් සහ පොල් මිල හේතුවෙන් ඉහළ යන වියදමට වඩා විශාල වුවද, දෙවැන්න මගින් පුද්ගලයෙකුට දැනෙන උද්ධමනයට වැඩි බලපෑමක් ඇති විය හැකිය. මීට අමතරව, උද්ධමනය පිළිබඳ සංකල්පය පිළිබඳ අවබෝධයක් නොමැතිකම ද ඉහත සඳහන් වෙනස සඳහා දායක විය හැකිය.

2022 සහ 2023 වසරවල දී ශ්‍රී ලංකාව අත්විඳින ලද අතිශයින් ඉහළ උද්ධමන මට්ටම් සැලකිල්ලට ගත් කළ, ජීවන වියදමේ විශාල වැඩිවීමෙන් තවමත් යථා තත්ත්වයට පත්වෙමින් සිටින ගෘහ ඒකක සඳහා කෙටි කාලීන අවධමන තත්ත්වයක් තුළින් යම් සහනයක් ලැබේ. කෙසේ වෙතත්, දිගු කාලීන අවධමනය ද නුසුදුසු වන්නේ එවැනි කාලපරිච්ඡේද තුළ දී බොහෝ විට ආර්ථික වර්ධනයක් සිදු නොවීමටත්, විරැකියා මට්ටම ඉහළ යෑමටත් හේතු වන බැවිනි. ශ්‍රී ලංකාව පිළිබඳව සලකා බලන විට දිගු කාලීන අවධමනයක් ඇති වීමට අවස්ථාවක් නොමැති අතර, උද්ධමනය මැදි කාලීනව ඉලක්කය වෙත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මූලාශ්‍ර:

1. D’Acunto, F., Malmendier, U., Ospina, J., & Weber, M. (2021). Exposure to grocery prices and inflation expectations. *Journal of Political Economy*, 129(5), 1615-1639.
2. Georganas, S., Healy, P. J., & Li, N. (2014). Frequency bias in consumers′ perceptions of inflation: An experimental study. *European Economic Review*, 67, 144-158.

3.2. මූර්ත අංශය

ශ්‍රී ලංකා ආර්ථිකය, ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත්වීම අඛණ්ඩව පිළිබිඹු කරමින් 2024 වසරේ තුන්වන කාර්තුවේ දී ප්‍රසාරණය වූ අතර, 2024 වසරේ පළමු මාස නවය තුළ දී ධනාත්මක වර්ධන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දළ දේශීය නිෂ්පාදිත ඇස්තමේන්තුවලට අනුව, ප්‍රධාන අංශ තුනෙන් ම ධනාත්මක දායකත්වයක් ලබා ගනිමින්, 2024 වසරේ තුන්වන කාර්තුවේ දී ශ්‍රී ලංකා ආර්ථිකය (වාර්ෂික ලක්ෂ්‍යමය පදනමින්) සියයට 5.5කින් වර්ධනය විය.

මෙම කාලය තුළ දී ප්‍රධාන වශයෙන් සත්ව නිෂ්පාදනය, තේ සහ පලතුරු වගාව හේතුවෙන් කෘෂිකාර්මික කටයුතුවල වර්ධනයක් වාර්තා විය. කර්මාන්ත අංශයේ සැලකිය යුතු වර්ධනයට ඉදිකිරීම්, නිෂ්පාදන සහ පතල් හා කැණීම් කටයුතු හේතු විය. මේ අතර, නවාතැන්, ප්‍රවාහන, තොරතුරු තාක්ෂණ වැඩසටහන් සහ මූල්‍ය සේවා ක්‍රියාකාරකම්වල ධනාත්මක වර්ධනය, සේවා අංශයේ ප්‍රසාරණයට බොහෝ දුරට සහාය විය.

01 සංඛ්‍යා සටහන: මූර්ත ද.දේ.නි. වර්ධන ඇස්තමේන්තු (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, %) (තාවකාලික)

ආර්ථික කටයුතු	2023					2024			
	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන්වන කාර්තුව	සිව්වන කාර්තුව	වාර්ෂික	පළමු කාර්තුව	දෙවන කාර්තුව	තුන්වන කාර්තුව	පළමු මාස නවය
කෘෂිකර්මාන්තය	1.6	4.2	4.2	0.6	2.6	1.1	1.7	3.0	1.9
කර්මාන්ත	-24.3	-11.7	-0.7	7.9	-9.2	11.8	10.9	10.8	11.2
සේවා	-4.6	-0.5	1.7	2.8	-0.2	2.6	2.5	2.6	2.6
ද.දේ.නි.	**-10.7**	**-3.0**	**1.6**	**4.5**	**-2.3**	**5.3**	**4.7**	**5.5**	**5.2**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉදිරි ආර්ථික දර්ශකවලින් පිළිබිඹු වන පරිදි, 2024 වසරේ සිව්වන කාර්තුව තුළ ආර්ථිකයේ ධනාත්මක වර්ධන ප්‍රවණතාවට ප්‍රධාන වශයෙන් කර්මාන්ත හා සේවා ක්‍රියාකාරකම් දායකත්වය ලබා දී ඇත. වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2024 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර්[12] මාසවල දී කාර්මික නිෂ්පාදන දර්ශකය ඉහළ ගියේය. ධනාත්මක ප්‍රවණතා පිළිබිඹු කරමින්, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, කාර්තුවේ මාස තුනෙහි ම ප්‍රසාරණයන් වාර්තා කළේය. මේ අතර, ඉදිකිරීම් කටයුතුවල යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ද 2024 වසරේ ඔක්තෝබර් සහ නොවැම්බර්[13] මාසවල දී ඉහළ ගියේය. සේවා අංශය සලකා බලන විට, 2024 වසරේ සිව්වන කාර්තුව තුළ සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය ශක්තිමත්ව පැවතීම මගින් සමස්ත සේවා ක්‍රියාකාරකම්වල ධනාත්මක වර්ධනයක් පෙන්නුම් කරයි. තවද, සංචාරක පැමිණීම් ඉහළ යෑමේ ප්‍රතිලාභ ලබමින් නවාතැන්, ආහාර පාන සැපයීමේ සේවා සහ ප්‍රවාහනයට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් කිහිපයක ධනාත්මක වර්ධනයන් ද සේවා ක්‍රියාකාරකම්වල

[12] පවතින නවතම දත්තවලට අනුව, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ද සමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.

[13] ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරමින්, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය 51.4ක් විය.

වර්ධනයට දායක වී ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රධාන වශයෙන් අයහපත් කාලගුණික තත්ත්වයන්හි බලපෑම හේතුවෙන් 2024 වසරේ සිව්වන කාර්තුව තුළ කෘෂිකාර්මික කටයුතුවල මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් අපේක්ෂිතය.

11 රූප සටහන: ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල වෙනස් වීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ස්ථාවර මිල ගණන් අනුව වියදම් ප්‍රවේශය සැලකීමේ දී, ප්‍රධාන වියදම් සංරචකය වන පරිභෝජන වියදම අඛණ්ඩ වර්ධනයක් වාර්තා කළ අතර, ආයෝජන වියදම් ද 2024 වසරේ තුන්වන කාර්තුව තුළ දී සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කළේය. තවද, මූර්ත අගය අනුව භාණ්ඩ හා සේවා ආනයන වර්ධන වේගය අපනයන වර්ධන වේගය අභිබවා යෑම හේතුවෙන්, 2024 වසරේ තුන්වන කාර්තුව තුළ දී ශුද්ධ විදේශීය ඉල්ලුම පහළ යෑමක් වාර්තා කළේය.

02 සංඛ්‍යා සටහන: සමස්ත ඉල්ලුම (තාවකාලික)

අයිතමය	ස්ථාවර මිල අනුව (2015)							
	2023 තුන්වන කාර්තුව		2024 තුන්වන කාර්තුව		2023 පළමු මාස නවය		2024 පළමු මාස නවය	
	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %	රුපියල් බිලියන	වාර්ෂික ලක්ෂ්‍යමය %
දේශීය ඉල්ලුම	2,881	0.2	3,172	10.1	8,653	-6.1	9,236	6.7
පරිභෝජනය	2,415	0.8	2,503	3.6	6,808	-4.8	6,971	2.4
ආයෝජනය (දළ ප්‍රාග්ධන සම්පාදනය)	466	-2.8	669	43.6	1,845	-10.8	2,265	22.8
ශුද්ධ විදේශීය ඉල්ලුම	107	65.3	-20	-119	140	1208.8	14	-90.1
+ භාණ්ඩ හා සේවා අපනයන	729	28.9	794	8.9	1,997	11.5	2,259	13.1
- භාණ්ඩ හා සේවා ආනයන	622	24.2	814	30.8	1,857	3.0	2,245	20.9
ද.දේ.නි.	**2,988**	**1.6**	**3,152**	**5.5**	**8,794**	**-4.5**	**9,250**	**5.2**

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

3.3. මුදල් අංශය

පොලී අනුපාතික

ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ස්වෛරීත්ව අවදානම් අධිමිල පහළ යෑම හේතුවෙන් රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ඇතුළු වෙළඳපොළ පොලී අනුපාතික 2024 වසරේ දී සහ 2025 වසර මුල් කාලයේ දී සැලකිය යුතු ලෙස අඩු විය.

මහ බැංකුවේ ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය වෙළඳපොළ වෙත සම්ප්‍රේෂණය වීම පිළිබිඹු කරමින් සමස්ත පොලී අනුපාතික ව්‍යුහය අඛණ්ඩව පහළ ගියේය. 2024 වසරේ නොවැම්බර් මාසයේ දී මහ බැංකුවේ තනි ප්‍රතිපත්ති පොලී අනුපාතිකය වන එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීම මගින් වෙළඳපොළ වෙත මුදල් ප්‍රතිපත්තිය දැනුම් දීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීමට උපකාරී විය. ඒ අනුව, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ මහ බැංකුවේ මෙහෙයුම් ඉලක්කය වන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා සමගාමීව අඩු වී ඇති අතර ඒ සඳහා දේශීය මුදල් වෙළඳපොළෙහි ක්‍රියාකාරිත්වය ඉහළ යෑම සහාය විය. වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර මෙම කාලය තුළ තැන්පතු පොලී අනුපාතික අඩු වීම වඩාත් සැලකිය යුතු මට්ටමක පවතී. බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය මගින් පිළිබිඹු වන පරිදි, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් තම ප්‍රමුඛ ගනුදෙනුකරුවන්ට ලබා දෙන ණය සඳහා වන පොලී අනුපාතිකය, 2025 වසරේ ජනවාරි මාසය වන විට සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර අඛණ්ඩව සති කිහිපයක් මුළුල්ලේ එය සියයට 9.00ට වඩා අඩු මට්ටමක පැවතුණි. මේ අතර, බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය මගින් පෙන්නුම් කරන ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දෙන නව ණය සඳහා වන පොලී අනුපාතික ද 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස අඩු වී ඇත. කෙසේ වෙතත්, සමස්ත වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු වුවද, කුඩා පරිමාණ ණය ගැතියන් සඳහා ලබා දී ඇති ණය සඳහා වන පොලී අනුපාතික අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික හා සැසඳීමේ දී සාපේක්ෂව ඉහළ මට්ටමක පවතී.

12 රූප සටහන: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල වෙනස්වීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ලිහිල් මුදල් තත්ත්ව, රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු වීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ ප්‍රගතිය හේතුවෙන් වූ ධනාත්මක වෙළඳපොළ අපේක්ෂා පිළිබිඹු කරමින් 2024 වසරේ නොවැම්බර් මස මැද භාගයේ සිට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඒ අනුව, 2023 වසර අවසානයේ සිට 2025 වසරේ ජනවාරි මස අවසානය දක්වා කාලය තුළ භාණ්ඩාගාර බිල්පත් මත ඵලදා අනුපාතික ප්‍රතිශතාංක 4.46–6.58කින් අඩු වී ඇත.

නාමික වෙළඳපොළ පොලී අනුපාතිකවල අඩු වීමක් පැවතිය ද, පවතින අවධමනකාරී තත්ත්වය හේතුවෙන් වාර්තා වූ උද්ධමන මට්ටම් භාවිතයෙන් ගණනය කරනු ලබන මූර්ත පොලී අනුපාතික අඛණ්ඩව ධන අගයක පවතී. කෙසේ වෙතත්, පුරෝකථනය කර ඇති පරිදි 2025 වසරේ දෙවන භාගයේ දී උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ළඟා වීමත් සමඟ මූර්ත පොලී අනුපාතික අඩුවිය හැකිය.

13 රූප සටහන: මූර්ත පොලී අනුපාතික



සටහන: නාමික පොලී අනුපාතිකය සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය (කො.පා.මි.ද. මත පදනම් වූ) ගැළපීමෙන් මාසික මූර්ත පොලී අනුපාතිකය ගණනය කර ඇත.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව

ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් හේතුවෙන් 2024 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා තත්ත්වයන් සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය.

ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීම හේතුවෙන් දේශීය මුදල් වෙළඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන් විශේෂයෙන් ම 2024 වසරේ හතරවන කාර්තුව තුළ දී සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. කෙසේ වෙතත්, ශුද්ධ පදනම මත, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය සහ භාණ්ඩාගාර බැඳුම්කර තොගයෙන් කොටසක් කල්පිරීම, රජය විසින් මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කූපන් ගෙවීම සහ බැංකු පද්ධතිය මගින් කාසි සහ නෝට්ටු ලෙස මුදල් ආපසු ලබා ගැනීම, 2024 වසර තුළ දී දේශීය

මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඩුවීම සඳහා හේතු විය. වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වය 2025 වසරේ මුල් කාලයේ දී ද අඛණ්ඩව පැවති අතර එය සාමාන්‍යයක් ලෙස රුපියල් බිලියන 150ක් පමණ විය. කෙසේ වෙතත්, වෙළඳපොළ සහභාගීවන්නන් අතර ද්‍රවශීලතාවයේ අසමමිතික ව්‍යාප්තිය අඛණ්ඩව නිරීක්ෂණය විය.

වෙළඳපොළ සහභාගීවන්නන් අතර ද්‍රවශීලතාව පිළිබඳ නිශ්චිතභාවයක් ලබා දීම සඳහා විවට වෙළඳපොළ කටයුතු යටතේ එක්දින සහ කෙටි කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි හරහා අවශ්‍යතාව අනුව ද්‍රවශීලතාව සැපයීමට මහ බැංකුව කටයුතු කළේය. කෙසේ වෙතත්, ද්‍රවශීලතා තත්ත්වයන් සැලකිය යුතු ලෙස අතිරික්ත මට්ටම්වල පැවතීමත් වෙළඳපොළ සහභාගීවන්නන් අතර ක්‍රියාකාරකම් වැඩිදියුණු වීමත් සමඟ විවට වෙළඳපොළ කටයුතු පැවැත්වීම ක්‍රමයෙන් අඩු කර ඇත. බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, 2024 වසරේ දෙසැම්බර් මස දෙවන භාගයේ සිට එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මත හෝ ඒ ආසන්නයේ අඛණ්ඩව පැවතුණු අතර බරිත සාමාන්‍ය ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය ද බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය හා අනුකූලව විචලනය විය.

14 රූප සටහන: එක්දින මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය සහ නිත්‍ය පහසුකම් අනුපාතිකවල හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

දේශීය ණය තත්ත්ව සහ මුදල් සැපයුම

පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම මෙන්ම බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් ප්‍රසාරණය වීම 2024 වසර තුළ පුළුල් මුදල් සැපයුමේ (M_{2b}) අඛණ්ඩ ප්‍රසාරණය සඳහා දායක විය.

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය 2024 වසරේ මැයි මාසයේ සිට ඉහළ ගිය අතර, මෑත මාසවල දී අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා වැඩි වේගයකින් ප්‍රසාරණය විය. බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය සියයට 10.7ක වාර්ෂික වර්ධනයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 790කින් පමණ සැලකිය යුතු ලෙස වර්ධනය විය. අඩු වෙළඳපොළ ණය පොලී අනුපාතික සහ ආනයන ඉල්ලුම ඉහළ යෑම මෙන්ම දේශීය ආර්ථික ක්‍රියාකාරකම් අපේක්ෂිත ලෙස අඛණ්ඩව ප්‍රසාරණය වීමේ සහායයෙන් පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය වර්ධනය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

15 රූප සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි මාසික වෙනස්වීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගිය ද, මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය තොගය අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු වෙමින්, 2024 වසර තුළ දී බැංකු පද්ධතිය විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සුළු වශයෙන් සංකෝචනය විය. ප්‍රධාන වශයෙන් මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය අඩු කිරීම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම භාවිත කිරීම අඩු වීම හේතුවෙන් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස පහළ ගියේය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජයේ සුරැකුම්පත්වල සිදු කළ ආයෝජන ඉහළ යෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය 2024 වසර තුළ දී ඉහළ යෑමක් වාර්තා කළේය.

ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව, මාර්ග සංවර්ධන අධිකාරිය, කොළඹ කොමර්ෂල් පොහොර සමාගම, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය සහ ශ්‍රීලන්කන් ගුවන් සමාගම ඇතුළු රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය තොගයෙන් යම් කොටසක් නැවත පියවීම හේතුවෙන් 2024 වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය සතු වාණිජ ව්‍යාපාර වෙත ලබා දුන් ණය පහළ ගියේය.

විදේශීය අංශයේ දක්නට ලැබුණු වැඩිදියුණු වීම් පිළිබිඹු කරමින්, මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස වැඩි විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් විදේශ විනිමය ශුද්ධ වශයෙන් මිලදී ගැනීම මේ සඳහා හේතු වූ අතර, එය දළ නිල සංචිත ඉහළ යෑමට හේතු විය. අඛණ්ඩව වසර තුනක් මුළුල්ලේ සෘණ මට්ටම්වල පැවති මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්, 2024 වසරේ ඔක්තෝම්බර් මාසයේ දී නැවත ධන අගයක් වාර්තා කළේය. මේ අතර, 2024 වසර තුළ දී විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීමෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන වශයෙන් ප්‍රත්‍යාගණන බලපෑම් හේතුවෙන් වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු සතු ශුද්ධ විදේශීය වත්කම් පහළ ගියේය.

මෙම ප්‍රවණතා සහ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමත් සමඟ පුළුල් මුදල් වර්ධනය (M_{2b}), 2023 වසරේ පැවති සියයට 7.3ක වාර්ෂික වර්ධනය හා සැසඳීමේ දී 2024 වසරේ දී සියයට 8.6ක් දක්වා ඉහළ ගියේය.

16 රූප සටහන: පුළුල් මුදල්වල (M_{2b}) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා දායකත්වය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.4. විදේශීය අංශය

ඉහළ ගිය විදේශ විනිමය ලැබීම් හේතුවෙන් ඇති වූ ඇස්තමේන්තුගත ජංගම ගිණුම් අතිරික්තය, ශක්තිමත් සංචිත තත්ත්වය සහ ශ්‍රී ලංකා රුපියලෙහි තවදුරටත් වූ ස්ථාවරත්වය මගින් පිළිබිඹු වූ එහි ධනාත්මක ප්‍රවණතාවය, විදේශීය අංශය අඛණ්ඩව 2024 වසරේ දී පවත්වාගෙන ගියේය.

ගෙවුම් තුලනය

වසර තුළ දී වූ ධනාත්මක වර්ධනයන් පිළිබිඹු කරමින් 2024 වසරේ දී ජංගම ගිණුමේ ශේෂය අඛණ්ඩව දෙවන වසරටත් අතිරික්තයක් වාර්තා කර ඇති බවට ඇස්තමේන්තු කර ඇත. 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.9ක් වූ වෙළඳ හිඟය 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා පුළුල් විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී අපනයන ඉපැයීම් (සියයට 7.2කින්) ඉහළ යෑමට වඩා වැඩි වේගයකින් ආනයන වියදම් (සියයට 12.1කින්) වැඩි වීමයි. කෙසේ වුවත්, සංචාරක ඉපැයීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ආශ්‍රිත ලැබීම් සහ අනෙකුත් සේවා ලැබීම් අපේක්ෂිත මට්ටම්වලට වඩා ඉහළ ගියේය.

17 රූප සටහන: වෙළඳ ශේෂය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

2024 වසරේ දී මිලියන 2කට අධික සංචාරක පැමිණීම් සමඟ 2023 වසරට සාපේක්ෂව සියයට 53.2ක වැඩි වීමක් වාර්තා කරමින්, ඇස්තමේන්තුගත සංචාරක ඉපැයීම් එ.ජ. ඩොලර් බිලියන 3.2ක් දක්වා වර්ධනය විය. සංචාරක ඉපැයීම් හැරුණු විට, මුහුදු ප්‍රවාහන සේවා සහ පරිගණක හා තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවාවන් 2024 වසරේ දී සේවා අංශයේ ලැබීම්වලට ප්‍රධාන වශයෙන් දායක වූ අනෙකුත් අංශ විය. ඒ අනුව, සංචාරක ඉපැයීම් හැර සේවා අංශය වෙත වූ ලැබීම් 2023 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 3.3ට සාපේක්ෂව 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.7ක් විය. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ද 2023 වසරේ දී වාර්තා කළ එ.ජ. ඩොලර් බිලියන 6.0ක සිට 2024 වසරේ දී සියයට 10.1ක වර්ධනයක් වාර්තා කරමින් එ.ජ. ඩොලර් බිලියන 6.6ක් දක්වා වර්ධනය විය.

18 රූප සටහන: විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය



මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
බලපත්‍රලාභී බැංකු

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

19 රූප සටහන: ජංගම ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

2024 වසරේ දී ජංගම ගිණුමේ ක්‍රියාකාරිත්වය ධනාත්මක වර්ධනයන් පෙන්නුම් කළ ද, මූල්‍ය ගිණුම සීමිත ප්‍රවාහයන් සමඟ මන්දගාමීව පැවතුණි. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී, සෘජු ආයෝජන ව්‍යවසායයන් සඳහා ලැබුණු විදේශ ණය ඇතුළුව, විදේශ සෘජු ආයෝජන ලැබීම්වල සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. 2024 වසරේ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළහි විදේශීය ආයෝජනවල එ.ජ. ඩොලර් මිලියන 179ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය. කෙසේ වෙතත්, වසරේ අවසාන මාස තුන තුළ මෙම ප්‍රවණතාවය වෙනස් වෙමින් ශුද්ධ ලැබීම් වාර්තා විය. මේ අතර, ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන ලැබීම් හේතුවෙන් කොළඹ කොටස් වෙළඳපොළ විදේශීය ආයෝජන ශුද්ධ ලැබීම් එ.ජ. ඩොලර් මිලියන 33ක් වාර්තා කළේය.

20 රූප සටහන: මූල්‍ය ගිණුම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

විනිමය අනුපාතිකය

2024 වසරේ දෙවන භාගය තුළ දී විටින් විට ඇති වූ යම් අවප්‍රමාණය වීමේ පීඩනයන් මධ්‍යයේ වුවද, 2024 වසරේ පළමු භාගයේ සිට වසර පුරා ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීමේ ප්‍රවණතාවය පැවතුණි. විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ යෑම, සේවා අපනයන ඉහළ යෑම සහ අපනයන ආදායම් පරිවර්තනයන් හේතුවෙන් විදේශ විනිමය ලැබීම් ශක්තිමත්ව පැවතුණ ද, විශේෂයෙන් ම 2024 වසරේ අගෝස්තු, සැප්තැම්බර් සහ දෙසැම්බර් මාසවල දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ ද්‍රවශීලතාවය විටින් විට පහත වැටුණි. මෙම පීඩනයන් ප්‍රධාන වශයෙන් ආනයන ගෙවීම් ඉහළ යෑම නිසා ඇති වූ අතර, විනිමය අනුපාතිකයේ වූ දෛනික උච්චාවචනයන් අවම කිරීම සඳහා ඇතැම් දිනවල දී මහ බැංකුවට දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වීමට සිදු විය. කෙසේ වෙතත්, 2024 වසරේ දී මහ බැංකුව ශුද්ධ පදනම මත එ.ජ. ඩොලර් බිලියන 2.8කට වඩා මිලදී ගත් අතර, එය දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මෙතෙක් සිදු කළ ඉහළම වාර්ෂික විදේශ විනිමය ශුද්ධ මිලදී ගැනීම ලෙස වාර්තා විය. මහ බැංකුව සිදු කළ ඉහළ මිලදී ගැනීම් මධ්‍යයේ වුවද, 2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල එ.ජ. ඩොලරයට සාපේක්ෂව සියයට 10.7කින් අතිප්‍රමාණය විය. කෙසේ වෙතත්, 2025 වසරේ මුල් කාලයේ දී ශ්‍රී ලංකා රුපියලයෙහි යම් විචලනයක් නිරීක්ෂණය වූ අතර, 2025 වසරේ ජනවාරි මස 28 වන දින දක්වා සියයට 2.0කින් අවප්‍රමාණය වී ඇත. මේ අතර, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින්, 2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ, ස්ටර්ලින් පවුම, චීන යුවාන්, ජපන් යෙන්, ඉන්දියානු රුපියල සහ ඕස්ට්‍රේලියානු ඩොලරය වැනි අනෙකුත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව අතිප්‍රමාණය විය.

21 රූප සටහන: විනිමය අනුපාතිකයේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචිත වත්කම්

දළ නිල සංචිත 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 4.4ට සාපේක්ෂව, 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා ඉහළ ගියේය. චීන මහජන බැංකුවෙන් ලද විදේශ විනිමය හුවමාරු පහසුකම 2023 වසර අවසානයේ දී සහ 2024 වසර අවසානයේ දී වූ දළ නිල සංචිතවලට ඇතුළත් වූ අතර, එය භාවිත කිරීමේ දී ඇතැම් කොන්දේසිවලට යටත් වේ. 2024 වසරේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් සිදු කළ සැලකිය යුතු විදේශ විනිමය ශුද්ධ මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ

ණය පහසුකමෙහි තුන්වන වාරිකය ඇතුළුව බහුපාර්ශ්වික ආයතනවලින් වූ ලැබීම් සංචිතවල කැපී පෙනෙන ඉහළ යෑමට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, දළ නිල සංචිත (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ඇතුළත්ව) මගින් ආවරණය කළ හැකි ආනයන ප්‍රමාණය 2024 වසරේ දෙසැම්බර් මස අවසන් වන විට ආනයනික මාස 3.9ක් විය.

22 රූප සටහන: මාසික දළ නිල සංචිත, සංචිත ප්‍රමාණාත්මකභාවය සහ ශුද්ධ මිලදී ගැනීම්



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

3.5. රාජ්‍ය මූල්‍ය අංශය[14]

රජය විසින් ක්‍රියාත්මක කරන ලද ආදායම් මත පදනම් වූ ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග හේතුවෙන් 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහ තුළ දී රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය අඛණ්ඩව වර්ධනය විය. එම ක්‍රියාමාර්ග ප්‍රාථමික ශේෂයේ සැලකිය යුතු අතිරික්තයකට සහ සමස්ත අයවැය හිඟය අඩුවීමට හේතු විය.

ශක්තිමත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යෑම හේතුවෙන් 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහ තුළ දී නාමික වශයෙන් සහ පුරෝකථනය කළ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සමස්ත අයවැය ශේෂය, වර්තන ගිණුමේ ශේෂය සහ ප්‍රාථමික ශේෂය යන ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්වල වැඩි දියුණුවක් ඇති විය. ඒ අනුව, 2024 වසරේ පළමු මාස එකොළහ තුළ දී ප්‍රාථමික ශේෂය, රුපියල් බිලියන 927.8ක සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළ අතර එම සලකා බලන ලද කාල සීමාව තුළ දී සමස්ත අයවැය හිඟය රුපියල් බිලියන 1,217.3ක් දක්වා අඩු විය.

2023 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වූ මාස එකොළහ තුළ දී රජයේ මුළු ආදායම සහ ප්‍රදාන සැලකිය යුතු ලෙස වැඩි විය. එකතු කළ අගය මත බද්ද සහ නිෂ්පාදන/සුරා බදු සඳහා සිදු කරන ලද මෑතකාලීන ප්‍රතිසංස්කරණ මගින් ඉහළ ගිය එම බදු ආදායම මෙන්ම වැඩි දියුණු වූ ආර්ථික ක්‍රියාකාරකම්වල බලපෑම ද රජයේ ආදායම වර්ධනයට මූලික වශයෙන් දායක විය. ඒ අතර ම, අඛණ්ඩ ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ බදු පරිපාලනය වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ මුල් මාස එකොළහ තුළ මුළු බදු ආදායමෙන් සියයට 28.8ක ප්‍රමාණයක් නියෝජනය කරමින්, රජයේ

[14] 2024 වසරේ නොවැම්බර් මස දක්වා වූ රාජ්‍ය මූල්‍ය දත්ත පමණක් ලැබී තිබුණි.

ආදායම් බදු එකතුවෙහි කැපී පෙනෙන වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් පෙන්නුම් කළේය. 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වන මාස එකොළහ තුළ ප්‍රධාන වශයෙන් පොලී ආදායම් ලැබීම් වැඩි වීම හේතුවෙන් බදු නොවන ආදායම ද වැඩි විය. මේ අතර, පසුගිය වසරට සාපේක්ෂව 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වූ මාස එකොළහ තුළ දී සමස්ත වියදම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සුළු වැඩි වීමක් වාර්තා කළේය. සමාලෝචිත කාල සීමාව තුළ ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම මෙන්ම වැටුප්, සහනාධාර සහ සංක්‍රාම ගෙවීම් සඳහා වන පුනරාවර්තන වියදම් ඉහළ ගිය ද, ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ අවදානම් අධිමිල අඩුවීමේ ප්‍රතිලාභය හේතුවෙන් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතික පහත වැටීම නිසා පොලී වියදම් සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය.

බොහෝ දුරට විදේශීය ප්‍රාග්ධන වෙළඳපොළ වෙත ප්‍රවේශ වීමට පවතින සීමා හේතුවෙන් 2024 වසරේ නොවැම්බර් මාසයෙන් අවසන් වූ මාස එකොළහ තුළ දී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි. මේ අතර, මධ්‍යම රජයේ නොපියවූ ශුද්ධ ණයෙහි[15] රුපියල් අගය 2023 වසර අවසානයේ වාර්තා වූ රුපියල් ට්‍රිලියන 28.7 සිට 2024 වසරේ නොවැම්බර් අවසානය වන විට රුපියල් ට්‍රිලියන 28.2ක් දක්වා සුළු වශයෙන් අඩු විය.

23 රූප සටහන: ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂ



මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

තවද, රටේ ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත් කර ගැනීමේ ගමන්මගෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්, 2024 වසර අවසන් වන විට, රජය විසින් සිය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය, ඉතා සුළු කොටසක් හැර, සාර්ථකව නිම කරන ලද අතර, එමගින් ණය හිමියන් සහ බාහිර හවුල්කරුවන් සමඟ සබඳතා සාමාන්‍ය පරිදි සිදු කර ගැනීමට මග පාදන ලදී. මෙම වර්ධනයන්ගෙන් පසුව, ප්‍රමුඛ ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන

15 මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2022 වසරේ අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණය පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ. තවද, ණය සංඛ්‍යාලේඛන ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.

වන ෆිච් සහ මූඩිස් මගින් 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ණය ශ්‍රේණිගත කිරීම්, පිළිවෙලින්, RD සහ Ca සිට CCC+ සහ Caa1 වෙත උසස් කරන ලද අතර, එය රටේ අවදානම් අධිමිල සැලකිය යුතු ලෙස පහළ යැමට හේතු විය. විදේශීය අංශයේ දුර්වලතා සඳහා පිළියම් යෙදීමේ දී අත් කර ගත් ප්‍රගතිය සහ තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා ශ්‍රී ලංකාව දරන ප්‍රයත්න ජාත්‍යන්තර ප්‍රජාව විසින් පිළිගෙන ඇති බව මෙම වර්ධනයන් සනාථ කරයි.

3.6. මූල්‍ය අංශය

සාර්ව ආර්ථික ස්ථායීතාව ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමග, දේශීය සාර්ව මූල්‍ය තත්ත්වයන් 2024 වසරේ දී අඛණ්ඩ ව වර්ධනය විය.

හිතකර ආර්ථික වර්ධනය සහ අවධමනකාරී තත්ත්වයන් හේතුවෙන්, කුටුම්භ සහ ව්‍යාපාරවල ශේෂ පත්‍රය මත ඇති වූ පීඩනය යම් ප්‍රමාණයකට ලිහිල් වූ අතර, ණය ආපසු ගෙවීමේ හැකියාවන් ඉහළ නංවමින්, මූල්‍ය අංශයේ ණය අවදානම අඩු විය. ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස පෞද්ගලික අංශයේ ණය අනුපාත පරතරය (ණය පරතරය) මගින් පිළිබිඹු කෙරෙන ණය චක්‍රය, ණය පරතරය ක්‍රමයෙන් පුළුල් වීමත් සමග, ප්‍රසාරණ අවධිය තුළ ගමන් කළේය. පෞද්ගලික අංශය වෙත ලබා දෙන ණය යථා තත්ත්වයට පත් වීම සහ අඛණ්ඩ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවත් සමඟ, මූල්‍ය ආයතන රාජ්‍ය අංශය වෙත නිරාවරණය වීමේ නැඹුරුව අඩු වෙමින් පවතී.

24 රූප සටහන: ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස ණය පරතරය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

25 රූප සටහන: රජය සහ පෞද්ගලික අංශය වෙත නිරාවරණය වීම*



*බැංකු අංශයෙහි සහ බලපත්‍රලාභී මුදල් සමාගම්, රජය සහ පෞද්ගලික අංශය වෙත වන නිරාවරණය මෙමගින් නිරූපණය කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සාර්ව ආර්ථික තත්ත්වයන් ලිහිල් වීම හමුවේ මූල්‍ය අංශයේ ඔරොත්තු දීමේ හැකියාව 2024 වසර තුළ දී ක්‍රමයෙන් වැඩි දියුණු විය. ප්‍රධාන වශයෙන් ආයෝජන සහ ණය හා ලැබිය යුතු මුදල් ඉහළ යෑම හේතුවෙන්, සමාලෝචනයට යටත් වන කාලය තුළ දී බැංකු අංශයේ මුළු වත්කම් වර්ධනය විය. ඒ අනුව, 2024 වසර අවසානයේ දී බැංකු අංශයේ වත්කම් සියයට 8.7ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළ අතර, එහි වටිනාකම රුපියල් ට්‍රිලියන 22.2ක් විය. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් වීම හමුවේ, 2024 වසර අවසානයේ දී බැංකු අංශයේ දළ ණය සහ ලැබිය යුතු මුදල් වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත සියයට 4.1කින් වර්ධනය විය.

අදියර 3 ණය අනුපාතය තුළින් පිළිබිඹු වන, බැංකු අංශයේ සමස්ත ණය පැහැර හැරීමේ අවදානම, 2023 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 12.8ක අගයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී සියයට 12.3ක් දක්වා අඩු වූ නමුත්, එය 2024 වසර අවසානයේ දී සියයට 11.3ක් වූ මුදල් සමාගම් අංශයේ අදියර 3 ණය අනුපාතයට ඉහළින් රැඳී පැවතුණි. බැංකු අංශය තුළ ණය අවදානම ක්‍රමයෙන් ලිහිල් වීමක් පෙන්නුම් කරමින් අදියර 3 ණය, වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත, 2024 වසරේ ජූනි මාසයේ සිට සංකෝචනය වී ඇත. 2023 වසරට සාපේක්ෂ ව, 2024 වසර තුළ දී බැංකු අංශයේ බදු පසු ලාභය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ඒ අනුව, බැංකු අංශය 2023 වසරේ වාර්තා කළ රුපියල් බිලියන 188.4ට සාපේක්ෂ ව, 2024 වසරේ දී රුපියල් බිලියන 309.8ක බදු පසු ලාභයක් වාර්තා කළේය.

ද්‍රවශීලතා ආවරණ අනුපාත සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාත මගින් මනිනු ලබන බැංකු අංශයේ ද්‍රවශීලතා තත්ත්ව, පෙර වසරේ අවසානයට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී වර්ධනය විය. බැංකු අංශයේ රුපියල් ද්‍රවශීලතා ආවරණ අනුපාතය, 2023 වසර අවසානයේ දී වාර්තා වූ සියයට 340.8ට සාපේක්ෂ ව, 2024 වසර අවසානයේ දී 349.9ක් දක්වා ඉහළ ගිය අතර, අවම නියාමන අවශ්‍යතාව වන සියයට 100කට වඩා ඉතා ඉහළ අගයක් පෙන්නුම් කළේය. අවදානම් බරිත වත්කම් ඉහළ ගිය ද, නියාමන ප්‍රාග්ධනයේ ඉහළ වර්ධනයෙහි ප්‍රතිඵලයක් ලෙස, බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය 2023 වසර අවසානයේ පැවති සියයට 17.0ට සාපේක්ෂ ව 2024 වසර අවසානයේ දී සියයට 18.4ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේ ය. ප්‍රකාශයට පත් කළ රඳවා ගත් ඉපැයුම් සහ සුදුසුකම් ලබන

ස්ථර-2 ප්‍රාග්ධන උපකරණ ඉහළ යෑම මෙන්ම, ශුද්ධ විලම්බිත බදු වත්කම් පහළ යෑම හේතුවෙන් බැංකු ආයතනවල නියාමන ප්‍රාග්ධනය, වාර්ෂික ලක්ෂ්‍යාමය පදනම මත සියයට 15.5ක කැපීපෙනෙන වර්ධනයක් වාර්තා කළ අතර, අනාගතයේ දී ඇති විය හැකි අලාභ අවශෝෂණය කර ගැනීම සඳහා ඔවුන් සතු හැකියාව පුළුල් කරන ප්‍රාග්ධන ස්වාරක්ෂකවල වර්ධනය ඉන් පිළිබිඹු කෙරේ.

ප්‍රධාන වශයෙන් මූල්‍ය කල්බදු, උකස් කිරීම්/ රන් ණය සහ පෞද්ගලික ණය ඉහළ යෑම හේතුවෙන් මුදල් සමාගම් අංශය, 2024 දෙසැම්බර් මාසය අවසානයේ දී සිය ණය සහ අත්තිකාරම් කළඹෙහි සියයට 20.9ක වාර්ෂික ලක්ෂ්‍යාමය ප්‍රසාරණයක් වාර්තා කළේය. මෙම අංශයේ දළ අක්‍රීය ණය අනුපාතය, 2023 වසරේ දෙසැම්බර් අග වන විට වාර්තා වූ සියයට 18.0ට සාපේක්ෂව 2024 වසරේ දෙසැම්බර් මාසය අවසානය වන විට සියයට 11.3ක් දක්වා අඩු වී ඇති අතර, එය ණය ගුණාත්මක භාවයේ දියුණුවක් පෙන්නුම් කරයි. 2024 දෙසැම්බර් අවසානයේ දී මෙම අංශයේ ද්‍රවශීලතා තත්ත්වය නියාමන අවශ්‍යතාවට වඩා ඉහළ අගයක පැවතුණි. තවද, මෙම අංශය 2024/25 මූල්‍ය වර්ෂයේ පළමු මාස නවය සඳහා රුපියල් බිලියන 43.1ක බදු පසු ලාභයක් වාර්තා කළ අතර, 2024 දෙසැම්බර් මස අවසානයේ දී සියයට 21.2ක ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතයක් වාර්තා කළේය.

කොටස් වෙළඳපොළ සලකා බැලීමේ දී, 2024 වසර තුළ සියලු කොටස් මිල දර්ශකයේ (All Share Price Index) සියයට 49.7ක සහ ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (S&P SL20)හි සියයට 58.5ක වර්ධනයක් වාර්තා කරමින් කොළඹ කොටස් හුවමාරුව 2024 වසර තුළ දී කැපී පෙනෙන ප්‍රගතියක් පෙන්නුම් කළේ ය. අඩු පොලී අනුපාතික පරිසරයක් හමුවේ වැඩිදියුණු වූ ආයෝජක අපේක්ෂා පිළිබිඹු කරමින් මෙම ධනාත්මක ප්‍රවණතාව 2025 වසර තුළ දී අඛණ්ඩව පැවතුණු අතර, ඒ සමඟින් ඉතිහාසයේ පළමු වරට සියලු කොටස මිල දර්ශකය දර්ශකාංක 17,000 ඉක්මවා ගියේය.

3.7. ගෝලීය ප්‍රවණතා

අඩු වෙමින් පවතින උද්ධමන තත්ත්වය මධ්‍යයේ අපේක්ෂිත ගෝලීය ආර්ථික වර්ධනයේ ස්ථාවර වීමත් සමඟ ලොව ප්‍රධාන මහ බැංකු සිය මුදල් ප්‍රතිපත්තිය වඩාත් සුපරීක්ෂාකාරීව ලිහිල් කිරීමට කටයුතු කළ ද, ගෝලීය අවිනිශ්චිතතා ඉහළ යෑමත් ප්‍රතිපත්ති දිශානතිය වෙනස්වීමත් තුළින් මුදල් ප්‍රතිපත්ති සාමාන්‍යකරණය වීමේ වේගය මන්දගාමී විය හැකි අතර එමගින් වර්ධන අපේක්ෂාවන්ට අවදානම් ඇති විය හැකිය.

ගෝලීය වශයෙන් උද්ධමනය අඩුවීම හේතුවෙන් බොහෝ මහ බැංකු ආර්ථික ක්‍රියාකාරකම් උත්තේජනය කිරීම සඳහා ඔවුන්ගේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය මන්දගාමී වේගයකින් ලිහිල් කිරීම ආරම්භ කර ඇති අතර, උද්ධමනය එහි ඉලක්කගත මට්ටම වෙත ගමන් කිරීම සහතික කිරීම සඳහා සුපරීක්ෂාකාරීව කටයුතු කරයි. කෙසේ වෙතත්, භූ දේශපාලනික අර්බුද, එක්සත් ජනපදයේ නව ජනාධිපතිවරයා යටතේ ප්‍රතිපත්ති වෙනස්වීම හේතුවෙන් සිදුවිය හැකි ගෝලීය බලපෑම් සහ සමහර කලාපවල උද්ධමනකාරී ප්‍රවණතා ඇතුළු ඉහළ ගෝලීය අවිනිශ්චිතතා, මුදල් ප්‍රතිපත්තිය සාමාන්‍යකරණය කිරීම ප්‍රමාද කර ඇති අතර, ගෝලීය වර්ධන අපේක්ෂා පිළිබඳව අවදානම් නිර්මාණය කර තිබේ. ජා. මූ. අරමුදලේ 2025 වසරේ ජනවාරි මස ලෝක ආර්ථික ඉදිරි දැක්ම (World Economic Outlook-WEO) යාවත්කාලීන වාර්තාවට අනුව, 2025 සහ 2026 වසරවල දී ගෝලීය වර්ධනය ඉතිහාසයේ වාර්තා වූ ගෝලීය වර්ධන සාමාන්‍යයට වඩා අඩු මට්ටමක ස්ථාවර වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර, සමහර රටවල සේවා උද්ධමනය ඉහළ යෑම හේතුවෙන් නිර්-උද්ධමනය මන්දගාමී වුවද, ගෝලීය නිර්-උද්ධමන ප්‍රවණතාවය අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

26 රූප සටහන: ගෝලීය ප්‍රතිපත්ති පොලී අනුපාතික වෙනස්වීම්



මූලය: https://www.cbrates.com

සැපයුම් දාමයන්ට බාධා කරන භූ දේශපාලනික අර්බුද සහ අහිතකර කාලගුණික තත්ත්වයන් හේතුවෙන් ඇතිවන සැපයුම් සහ ඉල්ලුම් අසමතුලිතතා මෙන්ම ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීමේ අසමානතාවයන් මත වෙනස් වන ගෝලීය ඉල්ලුම් තත්ත්වයන් හේතුවෙන් ගෝලීය භාණ්ඩ මිල ගණන් අස්ථාවරව පැවතුණි. 2024 වසරේ වැඩි කාලයක් ආහාර මිල ගණන්වල ක්‍රමික මාසික වැඩිවීමක් පැවතිය ද, ගෝලීය ආහාර මිල දර්ශකය, සාමාන්‍යයෙන්, 2023 වසරේ පැවති මට්ටමට වඩා පහළින් පැවතුණි. මේ අතර, 2024 වසර තුළ ගෝලීය බලශක්ති මිල ගණන් ද අස්ථාවරව පැවතුණි.

27 රූප සටහන: ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන්





මූලයන්: රෙෆිනිටිව් (රොයිටර්ස්), බ්ලූම්බර්ග් තොරතුරු සේවය, සෞදි ඇරම්කො

මූලය: ආහාර හා කෘෂිකර්ම සංවිධානය

ISBN 978-624-5917-94-5